# II. 1964 ආර්ථික හා මූල්‍ය හැඩගැස්ම

## (අ) ජාතික නිෂ්පාදිතය සහ වියදම

### හැඳින්වීම

1964 දී ලංකාවේ ආර්ථික වර්ධනයෙහි සැලකිය යුතු පුනරුත්ථාපනයක් ඇති විය. 1963 දී ඇතිවූ පහල වැටීමකින් පසු, මූර්ත නිෂ්පාදිතය, එනම් ස්ථාවර මිල අනුව දළ ජාතික නිෂ්පාදිතය, 1964 දී සියයට 1·9 කින් පමණක් වර්ධනය විය. තාවකාලික ඇස්තමේන්තු අනුව, 1964 මූර්ත නිෂ්පාදිතය සියයට 4·5 කින් වැඩිවිය. මේ අනුව, 1963 සහ 1964 සාමාන්‍ය වැඩිවීම් අනුපාතිකය සියයට 3·2 ක් විය. මෙය 1960 සිට 1962 තෙක් ඇති වූ සියයට 3·5 ගේ සාමාන්‍ය වර්ධනයට වඩා මඳක් අඩු විය.

ඒක ජන නිෂ්පාදිතය අනුව, ජනගහයේ වැඩිවීම් අනුපාතිකය පහළ වැටීම නිසා මෙම පුනරුත්ථාපනය වඩාත් කැපී පෙනේ. තාවකාලික ඇස්තමේන්තු අනුව 1964 දී ජනගහනයේ වර්ධනය සියයට 2·4ක්වූ* අතර, 1963 දී සියයට 2·6 ක්ද, 1962 දී සියයට 2·7 ක්ද විය. 1963 දී සියයට 0·6 කින් පහළ වැටුන ඒකජන මූර්ත නිෂ්පාදිතය 1964 දී සියයට 2·1 කින් වැඩිවිය. 1963 දී හා 1964 දී ඒකජන මූර්ත නිෂ්පාදිතයේ වැඩිවීමේ සාමාන්‍ය අනුපාතිකය සියයට 0·8 ක් විය. මෙය, 1960 සිට 1962 දක්වා වූ අවුරුදු තුළ ඇති වූ වැඩිවීමේ සාමාන්‍ය අනුපාතිකයට සමානය.

ආනයන මිළ මට්ටම වැඩිවීම නිසා වෙළෙඳ අනුපාතය තවදුරටත් පිරිහීගියෙන් අපනයනවල ක්‍රය ශක්තිය අඩුවිය. මෙම අවාසිදායක තත්ත්වය අනුව සලකා බලන කල ආනයන මිල වැඩිවීම ගණන් ගැනෙන මූර්ත ජාතික ආදායම වැඩිවීමේ අනුපාතිකය මූර්ත නිෂ්පාදිතය වැඩිවීමේ අනුපාතිකයට වඩා අඩු වී ඇති බව පෙනී යයි. මූර්ත ජාතික ආදායම වැඩිවූයේ සියයට 3·4 කින් මුත්, මූර්ත නිෂ්පාදිතය සියයට 4·5 කින් වැඩි වී ඇත. 1963 දී මූර්ත ජාතික ආදායම සියයට 0·5 කින් පහළ වැටී ඇත.

පවත්නා සාධක මිළ අනුව, දළ ජාතික නිෂ්පාදිතය සියයට 6·0 කින් වැඩිවිය. 1963 දී එහි වැඩිවීම සියයට 4·7 ක් විය. අපනයන අංශයේ පහළ වැටීමක් ඇතිවූ 1963 දී, දළ ජාතික නිෂ්පාදිතය වැඩි වූයේ මුළුමනින්ම දේශීය අංශයේ ඇති වූ ව්‍යාප්තිය හේතු කොට ගෙනය. එහෙත් එම වර්ෂයේදී මෙන් නොව, 1964 දී දළ ජාතික නිෂ්පාදිතයේ වැඩිවීමට දේශීය අංශය මෙන්ම අපනයන අංශයද ඉවහල් විය. 1963 දී සියයට 2.0 කින් පහළ වැටුනඅපනයන අංශයේ ශුද්ධ නිපැයුමේ වටිනාකම 1964 දී පොල් අපනයන වල වටිනාකම වැඩිවීමත් රබර් අපනයන වල වටිනාකම තරමක් දුරට වැඩිවීමත් හේතු කොට ගෙන සියයට 5.4 කින් වැඩිවිය. 1964 දී දේශීය අංශයේ ශුද්ධ නිපැයුමේ වටිනාකම සියයට 5·8 කින් වැඩි විය. එම වැඩිවීම අපනයන අංශයේ වැඩිවීමට වඩා වැඩිය. දේශීය අංශයේ ශුද්ධ නිපැයුමේ වටිනාකම වැඩිවීමට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ, ප්‍රවාහන හා පනිවුඩ හුවමාරුව, වෙළෙඳාම, වාසස්ථාන හිමිකම, රජයේ සේවා කර්මාන්ත යන මේවායේ ඇති වූ ව්‍යාප්තියයි. 1964 දී වී නිෂ්පාදනය ද සාමාන්‍ය ප්‍රමාණයෙකින් වැඩි විය. 1964 දී රුපියල් 627 ක්වූ ඒකජන මුදල් නිෂ්පාදිතය 1964 දී රුපියල් 649 දක්වා සියයට 3·5 කින් වැඩි වූයේය.

* මෙ අඩුවීමට ප්‍රධාන හේතුව වී ඇත්තේ, ජනගහනයේ දහ බැගින් ගෙන ලියාපදිංචි කොට ඇති දරු උපත් ගණන අඩුවීමය. එසේම ජනගහනයේ දහට ලියා පදිංචි කර ඇති මරණ සංඛ්‍යාව ද වැඩි වී ඇත.

පවත්නා වෙළෙඳ මිල අනුව මුළු දළ ජාතික වියදම 1964 දී සියයට 7·3 කින් වැඩි විය. විශේෂයෙන්ම ආනයන සඳහා වූ වියදම ඇතුළත් පාරිභෝජන වියදම සියයට 8·7 කින් වැඩි වූ අතර, ප්‍රාග්ධන සම්පාදනය සියයට 1·7 කින් අඩුවිය. පසුගිය වර්ෂයේදී පාරිභෝජන වියදම සියයට 3·4 කින් වැඩිවූ අතර ප්‍රාග්ධන සම්පාදනය සියයට 3·0 කින් අඩුවිය.

සංඛ්‍යා සටහන. II ( අ ) 1.

**නිෂ්පාදනය හා වියදම පිළිබඳ දර්ශක සාරාංශය – පවත්නා මිල අනුව**

| | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 |
|---|---|---|---|---|---|---|
| **අ. වටිනාකම** | | | | | | |
| (1) දළ ජාතික නිෂ්පාදිතය-සාධක මිල අනුව (රුපියල් දශ ලක්ෂ) .. .. .. | 5,854 | 6,080 | 6,142 | 6,418 | 6,716 | 7,121 |
| (2) දළ දේශීය වියදම–වෙළෙඳ මිල අනුව (රුපියල් දශ ලක්ෂ) .. .. .. | 6,618 | 6,823 | 6,822 | 7,020 | 7,193 | 7,714 |
| (3) පෞද්ගලික පාරිභෝජනය වෙළෙඳ මිල අනුව (රුපියල් දශ ලක්ෂ) .. .. .. | 4,678 | 4,991 | 4,849 | 5,010 | 5,184 | 5,641 |
| (4) රජයේ පාරිභෝජනය–වෙළෙඳ මිළ අනුව) (රුපියල් දශ ලක්ෂ) .– .. .. | 881 | 911 | 926 | 979 | 1,011 | 1,090 |
| (5) දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය–වෙළෙඳ මිළ අනුව (රුපියල් දශ ලක්ෂ) .. | 1,069 | 966 | 978 | 1,031 | 991 | 1,023 |
| (6) භාණ්ඩ අපනයන (අ) සහ සාධක නොවන සේවා (රුපියල් දශ ලක්ෂ) .. .. .. | 2,016 | 2,011 | 1,907 | 1,971 | 1,903 | 1,933 |
| (7) භාණ්ඩ අපනයන (ආ) සහ සාධක නොවන සේවා (රුපියල් දශ ලක්ෂ) .. .. .. | 2,176 | 2,209 | 1,972 | 2,070 | 2,031 | 2,086 |
| (8) දළ ජාතික නිෂ්පාදිතය–ප්‍රතිශීර්ෂ වශයෙන් (ඇ) සාධක මිල අනුව (රුපියල් දශ ලක්ෂ) .. | 608 | 614 | 604 | 615 | 627 | 649 |
| (9) දළ දේශීය වියදම් ප්‍රති ශීර්ෂ වශයෙන් (රුපියල්) .. .. .. | 688 | 689 | 671 | 672 | 672 | 704 |
| (10) දළ ජාතික නිෂ්පාදිතය 1959 සාධක මිල අනුව (රුපියල් දශ ලක්ෂ) .. .. .. | 5,854 | 6,078 | 6,260 | 6,493 | 6,620 | 6,919 |
| (11) දළ ජාතික නිෂ්පාදිත ප්‍රතිශීර්ෂ වශයෙන් (ඇ) 1959 සාධක මිල අනුව (රුපියල්) .. | 608 | 614 | 616 | 622 | 618 | 631 |
| **ආ. දර්ශක අංක (1959=100·0)** | | | | | | |
| (1) දළ ජාතික නිෂ්පාදිතය-සාධක මිල අනුව .. | 100·0 | 103·9 | 104·9 | 109·6 | 114·7 | 121·6 |
| (2) දළ දේශීය වියදම–වෙළෙඳ මිල අනුව .. .. | 100·0 | 103·1 | 103·1 | 106·1 | 108·7 | 116·6 |
| (3) පෞද්ගලික පාරිභෝජනය-වෙළෙඳ මිල අනුව .. | 100·0 | 106·7 | 103·7 | 107·1 | 110·8 | 120·6 |
| (4) රජයේ පාරිභෝජනය–වෙළෙඳ මිල අනුව .. | 100·0 | 103·4 | 105·1 | 111·1 | 114·7 | 123·7 |
| (6) දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය–වෙළෙඳ මිල අනුව .. .. .. | 100·0 | 90·4 | 91·5 | 96·5 | 92·7 | 95·7 |
| (6) භාණ්ඩ අපනයන (අ) සහ සාධක නොවන සේවා .. | 100·0 | 99·8 | 94·6 | 97·8 | 94·4 | 95·9 |
| (7) දළ ජාතික නිෂ්පාදිතය– (ආ) ප්‍රතිශීර්ෂ සහ සාධක නොවන සේවා .. .. .. | 100·0 | 101·5 | 90·6 | 95·1 | 93·3 | 95·9 |
| (8) දළ ජාතික නිෂ්පාදිතය–ප්‍රතිශීර්ෂ වශයෙන් (ඇ) සාධක මිල අනුව .. .. .. | 100·0 | 101·0 | 99·3 | 101·0 | 103·1 | 106·8 |
| (9) දළ දේශීය වියදම–ප්‍රතිශීර්ෂ වශයෙන් .. .. | 100·0 | 100·3 | 97·6 | 97·8 | 97·7 | 102·3 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

(අ ) අපනයන කළ වෙළෙඳ භාණ්ඩ–නැ. වි. ස. මිල-වටිනාකම

(ආ) ආනයනය කළ වෙළෙඳ භාණ්ඩ–මි. ර. ගැ.–වටිනාකම

(ආ) පහත සඳහන් ජන ඇස්තමේන්තු උපයෝගී කොටගෙන ඇත.

| | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 |
|---|---|---|---|---|---|---|
| මැදි අවුරුදු ජනගහනය | 96,25,000 | 98,96,000 | 1,01,68,000 | 1,04,43,000 | 1,07,12,0000 | 1,09,65,000 |
| දර්ශක අංක | 100·0 | 102·8 | 105·6 | 108·5 | 111·3 | 113·9 |

| | රුපියල් දශ ලක්ෂ | | | | | | වෙනසෙහි සියයට ගණන | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1960/1959 | 1961/1960 | 1962/1961 | 1963/1962 | 1964/1963 |
| I. ආනයන සඳහා නිෂ්පාදනය | | | | | | | | | | | |
| (i) දේශීය අපනයනය නැ. වි. ස. වටිනාකම | 1,692 | 1,775 | 1,681 | 1,766 | 1,705 | 1,842 | + 4·9 | — 5·3 | + 5·1 | — 3·5 | + 8·1 |
| තොග වෙනස්වීමේ වටිනාකම .. .. | — 2 | — 39 | + 15 | — 34 | + 3 | — 36 | | | | | |
| පාවිච්චි කළ ආනයන භාණ්ඩ හැර (වෙළෙඳ වටිනාකම) .. .. .. | —124 | —120 | —135 | —151 | —160 | —173 | | | | | |
| අපනයන කැරුන භාණ්ඩ බෙදහැරීමේ වියදම් හැර | —104 | —109 | —114 | —123 | —119 | —128 | | | | | |
| නිපැයුම (ශුද්ධ) .. .. .. | 1,462 | 1,507 | 1,447 | 1,458 | 1,429 | 1,506 | + 3·0 | — 4·0 | + 0·8 | — 2·0 | + 5·4 |
| (ii) ප්‍රති අපනයන: එකතු කළ වටිනාකම .. | 3 | 2 | 2 | 2 | 1 | 1 | | | | | |
| අපනයන සඳහා කැරුන මුළු නිෂ්පාදනය නිපැයුම (ශුද්ධ) .. .. .. .. | 1,465 | 1,509 | 1,449 | 1,460 | 1,430 | 1,507 | + 3·0 | — 3·9 | + 0·7 | — 2·0 | + 5·4 |
| II. දේශීය පාවිච්චිය සඳහා නිෂ්පාදනය (නිපැයුම ශුද්ධ) | | | | | | | | | | | |
| (i) කෘෂිකර්මය, දූව ඈ වන ද්‍රව්‍ය, පශු සම්පත හා ධීවර කර්මාන්තය .. .. .. | 1,276 | 1,341 | 1,385 | 1,426 | 1,531 | 1,594 | + 5·1 | + 3·3 | + 2·9 | + 7·3 | + 4·1 |
| (ii) කර්මාන්ත අන්තැනක නොසඳහන් .. | 255 | 305 | 342 | 406 | 484 | 533 | +19·3 | +12·1 | +19·0 | +19·1 | +10·0 |
| (iii) ප්‍රාග්ධන සංවර්ධනය (භාණ්ඩ හා සේවා) | | | | | | | | | | | |
| (අ) රජය .. .. .. | 189 | 146 | 193 | 204 | 200 | 188 | —22·4 | +31·6 | + 5·7 | — 1·6 | — 6·0 |
| (ආ) රජයේ ව්‍යාපාර .. .. .. | 55 | 61 | 65 | 86 | 107 | 86 | +11·5 | + 6·4 | +31·1 | +25·5 | —20·1 |
| (ඇ) පෞද්ගලික අංශය හා රජයේ සමායතන | 265 | 259 | 252 | 270 | 253 | 284 | — 2·2 | — 2·9 | + 7·2 | — 6·3 | +12·5 |
| (iv) ප්‍රවාහණය හා පණිවුඩ හුවමාරුව (රජයේ නොවන) .. .. | 450 | 493 | 476 | 500 | 522 | 595 | + 9·7 | — 3·4 | + 5·0 | + 4·4 | +13·9 |
| (v) වෙළෙඳම (රජයේ නොවන) .. .. | 628 | 633 | 608 | 643 | 707 | 754 | + 0·7 | — 4·0 | + 5·9 | + 9·9 | + 6·6 |
| (vi) නිවාස අයිතිය .. .. .. | 169 | 178 | 196 | 205 | 223 | 238 | + 5·9 | + 9·9 | + 4·5 | + 8·9 | + 6·6 |
| (vii) රජයේ: අන් තැනක නොසඳහන් .. | 702 | 755 | 759 | 792 | 821 | 869 | + 7·6 | + 0·6 | + 4·3 | + 3·7 | + 5·9 |
| (viii) සේවා: අන් තැනක නොසඳහන් .. | 438 | 445 | 457 | 474 | 491 | 508 | + 1·5 | + 2·8 | + 3·5 | + 3·7 | + 3·4 |
| එකතුව | 4,426 | 4,616 | 4,733 | 5,005 | 5,339 | 5,648 | + 4·3 | + 2·5 | + 5·7 | + 6·7 | + 5·8 |
| III. දළ-ජාතික නිෂ්පාදිතය .. .. | 5,891 | 6,124 | 6,182 | 6,464 | 6,769 | 7,155 | + 4·0 | + 0·9 | + 4·6 | + 4·7 | + 5·7 |
| IV. පිටරටින් ලැබූ සාධක ආදායම් (ශුද්ධ) | — 37 | — 44 | — 40 | — 47 | — 53 | — 34 | | | | | |
| V. දළ-ජාතික නිෂ්පාදිතය .. .. | 5.854 | 6.080 | 6.142 | 6 418 | 6.716 | 7.121 | + 3·9 | + 1·0 | + 4·5 | + 4·7 | + 6·0 |

ශීර්ෂ විග්‍රහය:

සබ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

1. රජය යන්නට, ශීර්ෂ (III) (අ) II (VII) මහ ආණ්ඩුව සහ පලාත් පාළන ආණ්ඩු අයත් වෙයි. එහෙත්, රජයේ සමායතන හා රජයේ ව්‍යාපාර (දුම්රිය, විදුලි වැඩ, වරාය කොමිෂම, තැපැල් හා තැපැල් පණිවිඩ සහ ලුණු දෙපාර්තමේන්තුව) ඇතුළත් නොවේ. 2. ශීර්ෂ II (VII) රජයේ අන් තැනෙක නොසඳහන්) ට, රජයේ ගොඩනැගිලිවල ආරෝපිත කුලිය ඇතුළත් වෙයි. 3. රාජ්‍ය අංශයේ ශුද්ධ ප්‍රාග්ධන සංවර්ධන නිපැයුමට (ශුද්ධ) (ශීර්ෂ 2 (III (අ) පහත ශීර්ෂ ඇතුළත් වෙයි. (අ) කොන්ත්‍රාත් පිට කැරුන රජයේ ප්‍රාග්ධන වැඩවල (ශුද්ධ) නිපැයුම සහ (ආ) ප්‍රාග්ධන සංවර්ධනයේදී කරන ලද අවශේෂ සේවා- උදා: රජයේ ආ‍ යනය කැරුන ප්‍රාග්ධන භාණ්ඩ ප්‍රවාහණය. 4. පෞද්ගලික අංශයේ සහ රජයේ සමායතන වල ප්‍රාග්ධන සංවර්ධනයේ (ශුද්ධ) නිපැයුමට(ශීර්ෂ 2 (III) (ඇ) පහත සඳහන් ශීර්ෂ ගැනේ. (අ) ගොඩනැගිලි කර්මාන්තවල (ශුද්ධ) නිපැයුම. (ආ) දේශීය ප්‍රයෝජනය සඳහා ගොඩ නැගිලි උපකරණ සහ අනෙකුත් ප්‍රාග්ධන භාණ්ඩ, නිපදවන කර්මාන්තයන්ගේ ශුද්ධ නිපැයුම සහ (ඇ) වගාවේ සහ නැවත වගාවේ ශුද්ධ නිපැයුම. 5. ශීර්ෂ 2 (IV) ට (ප්‍රවාහණය සහ පණිවුඩ හුවමාරුව (රජයේ නොවන) ) සහ ශීර්ෂ 2 ට (වෙළෙඳම (රජයේ නොවන) ) මේ අංශයේ ක්‍රියාත්මක වන රජයේ ව්‍යාපාර ගැනේ අපනයන අංශය සඳහා දරණ ලද සේවාවන්ද මේ ශීර්ෂ වලට ඇතුළත් වෙයි. පළින් පළ පිරික්සීමෙන් නිගමනය කැරෙන ප්‍රවාහණ ගාස්තු හා වෙළෙඳ ආන්තකය වැඩිවීම ගණන් ගැණෙන සේ වෙළෙඳ හා ප්‍රවාහණ ඇස්තමේන්තු ප්‍රතිශෝධි තය. 6. ශීර්ෂ 11 (I) කෘෂිකර්මය, දූව ඈ වන ද්‍රව්‍ය, පශු සම්පත් සහ ධීවර කර්මාන්තය මෙම ශීර්ෂයට ඇතුළත් කර ඇති තේ හා පොල් සඳහා ඇස්තමේන්තු සකස්කර ඇත්තේ ඒකජන පාරිභෝජනය පිළිබඳ සංඛ්‍යා තොරතුරු පදනම් කරගෙනය. 1959 සිට 1962 දක්වාවූ වර්ෂ සඳහා ඇස්තමේන්තු සකස් කිරීම සඳහා 1953 පාරිභෝගික අයවැය සමීක්ෂණයන් සංඛ්‍යා තොරතුරු ලබා ගන්නා ලද, අතර, 1963 සහ 1964 සඳහා ඇස්තමේන්තු සකස් කිරීම සඳහා 1963 පාරිභෝගික අය වැය සමීක්ෂණයෙන් සංඛ්‍යා තොරතුරු ලබාගන්නා ලදි. මේ අනුව 1963 සහ 1964 සඳහාවූ ඇස්තමේන්තු ඊට පෙර වර්ෂවල ඇස්තමේන්තු සමග කොහෙත්ම සැසඳෙන්නේ නොවේ.

පොදු සටහන්:

1. පළකර ඇති සංඛ්‍යාද, (ලංකා රෙගු වාර්තාවෙන්) සමහර නියමිත ශීර්ෂ සඳහා සංඛ්‍යා ගත් විශේෂ වාර්තාද එනම්, කර්මාන්ත හා කර්මාන්ත නිපැයුම් දෙපාර්තමේන්තුව හැර මේ සංඛ්‍යා සටහනද දළ ජාතික.වියදම් පිළිබඳ සටහනද සාදා ගැනීමට අවශ්‍යවූ මූලික සංඛ්‍යා තොරතුරු වලින් වැඩි කොටසක් සංඛ්‍යා සහ ජනලේඛන දෙපාර්තමේන්තුව විසින් කරුණා පෙරදැරිව සපයා ඇත. 2. සටහන්වල සංඛ්‍යා ලඟම දශමස්ථානයට ගෙන ඊම නිසා ශීර්ෂ එකතු හා මුළු එකතු වලින් වෙනස් විය හැකිය. 3, සංඛ්‍යා සටහන්වල වෙනස් වීමේ සියයට ගණන සකසා ඇත්තේ වටිනාකම රුපියල් දශ ලක්ෂවලින් මුල් දශමස්ථානයට ගෙන ඊමෙනි. 4. අ. නො= අන් තැනෙක නොසඳහන්. 5. 1963 සහ 1964 සඳහා වූ ඇස්තමේන්තු තාවකාලිකය

**නිෂ්පාදනය හා වියදම මුදල් අනුව**

දළ ජාතික නිෂ්පාදිතය සහ එහි සැකැසුම පවත්නා සාධක මිල අනුව II (අ)-2 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. 1964 දී දළ ජාතික නිෂ්පාදිතයේ වැඩිවීමෙහි ඉතාමත් කැපී පෙනෙන ලක්ෂණය වනුයේ මෙය ඇරඹෙන වර්ෂය වන 1959 යෙන් මෙපිට නොවූ විරූ අන්දමට අපනයන අංශය ව්‍යාප්ත වී යාමය. 1964 දී අපනයන අංශයේ ශුඬ නිමැවුම සියයට 5·4 ක වැඩිවීමක් දක්නට ලැබුනි. 1960 දී අපනයන අංශයේ ශුඬ නිමැවුම ඇතිවූ වර්ධනය සියයට 3·0 කි. මෙය පසුගිය වර්ෂ හතර තුළදී දක්නට ලැබුන ඉහළම වැඩිවීම් අනුපාතිකයයි. 1963 දී අපනයන අංශයේ ශුඬ නිමැවුම සියයට 2·0 කින් පහළ වැටුන බැව් මෙහිලා සැලකිය යුතුව ඇත. මේ අනුව, 1964 දී නිමැවුමෙහි ඇති වූ සැලකිය යුතු වර්ධනයට, 1963 දී නිමැවුම ඇතිවූ පහළ වැටීම එක්තරා ප්‍රමාණයකට බලපෑ බැව් පෙනී යයි. එසේ වුවද, 1962 මට්ටම සමග සසඳන විට, 1964 දී අපනයන අංශයේ ශුඬ නිමැවුම වැඩිවීම 3·2 කින් වැඩිය.

1964 දී තේ අපනයනයන්හි වටිනාකම සියයට 0·1 කින් සුළු වශයෙන් පමණක් වැඩි වුවද, රබර්, පොල් හා අනෙකුත් අපනයනවල වටිනාකම පිළිවෙලින් සියයට 12·9 කින්, සියයට 38·0 කින් හා සියයට 16·3 කින් වැඩිවිය. තේ අපනයන පරිමාව නොවෙනස්ව පසුගිය වර්ෂයේ මට්ටමෙහි පැවති මුත්, තේ රාත්තලක සාමාන්‍ය නැ. වි. ස. මිල සතයකින් වැඩිවිය. අපනයනය කරන ලද රබර් ප්‍රමාණය සියයට 20·8 කින් සැලකිය යුතු අන්දමින් ඉහළ ගිය මුත් රබර් රාත්තලක සාමාන්‍ය නැ. වි. ස. මිල සියයට 6·5 කින් පහළ වැටුනේය. පොල් අපනයන පරිමාව ඊටත් වඩා වැඩියෙන් සියයට 23·7 කින් වැඩිවිය. පොල්තෙල් හා කොප්පරා වල සාමාන්‍ය නැ. වි. ස. මිල පිළිවෙළින් සියයට 7·2 කින් හා 4·1 කින් වැඩිවූ නමුත්, කපාපු පොල් වල මිල සියයට 3·6 කින් පහළ වැටුනේය.

1964 දී මුළු අපනයන වටිනාකම සියයට 8·1 කින් වැඩිවිය. වර්ෂාවසානයේදී අපනයන තොගවල වටිනාකම ඉකුත් වර්ෂයේ තත්වයට සමකර බැලීමේදී රුපියල් කෝටි 35·7 කින් පහළ වැටී ඇතැයි ඇස්තමේන්තු කර ඇත. එසේ වුවද, 1964 දී අපනයන අංශයේ ශුඬ නිමැවුම සියයට 5·4 ක වැඩිවීමක් ඇති වූ බැව් පෙනී යන අතර, 1963 දී එම අංශයේ ශුඬ නිමැවුම සියයට 2·0 කින් පහළ වැටී ඇති බව පෙනේ. ශුඬ නිමැවුමෙහි වටිනාකමත් අපනයනවල වටිනාකමත් අතර ඇති වෙනසට හේතුවී ඇත්තේ තොග වටිනාකම්වල පහල වැටීමයි.

අපනයන අංශයේ පහළ වැටීමක් සිදුවූ 1963 වසරේදී දළ ජාතික නිෂ්පාදිතයේ වැඩිවීමක් ඇතිවූයේ සම්පූර්ණයෙන්ම දේශීය අංශයෙහි ඇතිවූ දියුණුව හේතු කොට බැව් 1963 වාර්ෂික වාර්තාවෙහි විශේෂයෙන් සඳහන් කැරිණි. 1964 දී දළ ජාතික නිෂ්පාදිතයේ වැඩිවීම කෙරෙහි දේශීය මෙන්ම අපනයන අංශයේ පිටිවහල ලැබුනද, දේශීය අංශයේ ශුද්ධ නිමැවුමෙහි වැඩිවීම අපනයන අංශයේ ශුද්ධ නිමැවුමේ වැඩිවීමට වඩා වැඩිවූයේය.

දේශීය අංශයෙහි ව්‍යාප්තියට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ ප්‍රවාහන හා, පණිවුඩ හුවමාරුව, වෙළෙඳම, වාසස්ථාන හිමිකම, රජයේ සේවාවන් යන මේවායේ ශුද්ධ නිමැවුම වැඩි වීමය. ප්‍රවාහන සේවාවේ ශුද්ධ නිමැවුම වැඩි වූයේ ප්‍රධාන වශයෙන්ම රජයේ ප්‍රවාහණ සේවාවන් ව්‍යාප්ත වීම හේතු කොට ගෙනය. රජයේ සේවාවන් වැඩිවූයේ රජයේ වැටුප් හා විශ්‍රාම වැටුප් වැඩිවීමෙනි. වී නිෂ්පාදනය ද පසුගිය වසරට වඩා මඳක් වැඩි වූයේ සියයට 2·6 ක් විය. පසුගිය වසරේ වැඩිවීම සියයට 2·3 ක් විය. මේ වර්ධනයට 1964 දී පැවති සතුටුදායක කාලගුණය හේතු වූවා විය හැකිය. අනෙක් අතට, මුළු ප්‍රාග්ධන සංවර්ධනය සියයට 0·3 කින් පහළ වැටින. පෞද්ගලික අංශයේ හා රජයේ සමායතන වල

ප්‍රාග්ධන සංර්ධනය සියයට 12·5 කින් ඉහළ ගිය නමුදු රාජ්‍ය ව්‍යවසායයන්ගේ* හා රජයේ අනෙකුත් දෙපාර්තමේන්තුවල ප්‍රාග්ධන සංවර්ධනය පිළිවෙළින් සියයට 20·1 කින් හා සියයට 6·0 කින් පහළ වැටින. කර්මාන්තවල ශුද්ධ නිමැවුම සියයට 10·0 කින් වැඩි වී ඇතැයි තාවකාලිකව ඇස්තමේන්තු කර ඇත. 1963 දී එහි වැඩිවීම සියයට 19·1 ක් විය. මෙකී සාධක හේතු කොට ගෙන සමස්ත දේශීය අංශයේ ශුද්ධ නිපැවුම සියයට 5·8 කින් වැඩිවිය. එය අපනයන අංශයේ ශුද්ධ නිමැවුමෙහි අනුපාතිකය වූ සියයට 5·4 ට වඩා වැඩි වූවෙකි.

1964 දී අපනයන හා දේශීය අංශය ඇතුළත්ව, දළ දේශීය නිමැවුම සියයට 5·7 කින් වැඩිවිය. 1963 දී එහි වැඩිවීම සියයට 4·7 ක් විය. පිටරටින් ලද ශුද්ධ සාධක ආදායමින් එනම්, අයෝජන ආදායමින් පසුගිය වර්ෂයේදීට වඩා ස්වල්පයක් අඩුවෙන් බැහැර ගිය බව දක්වෙයි. මේ අනුව, දළ ජාතික නිෂ්පාදිතය දළ දේශීය නිෂ්පාදිතයට වඩා සියයට 6·0 කින් වැඩි වූයේය. 1964/65 අය - වැය කථාවෙන් ඉදිරිපත් කැරුන ලාභ හා ලාභාංශ පැවරීම කල් තැබීමේ නිත්‍යානුකූල බලය, ආයෝජන ආදායම සුළු වශයෙන් පිටට ඇදී යෑමට තරමක් දුරට හේතුවිය.

මෙරට නිෂ්පාදිත භාණ්ඩ පිළිබඳ තොරතුරු පවත්නා නිෂ්පාදක මිල අනුව, II (අ) - 3 සංඛ්‍යා සටහනෙහි දක්වෙයි. 1964 දී පුවක් වල මිල පහළ වැටීම හේතු කොට ගෙන බුලත් හා පුවක් ගණය සියයට 7·2 කින් පහළ වැටිනි. එය හැරෙන්නට, මෙරට පාරිභෝජනය සඳහා වූ භාණ්ඩ වල නිෂ්පාදක වටිනාකමේ සාමාන්‍ය වැඩිවීමක් ඇති විය. මෙහි වඩාත් වැදගත් වෙනස්වීම් වනුයේ පොල් හා පොල් නිෂ්පාදිත වල නිෂ්පාදක වටිනාකම සියයට 9·2 කින්ද, මාළුවල නිෂ්පාදක වටිනාකම සියයට 9·6† කින්ද වැඩිවීමය. පොල් හා පොල් නිෂ්පාදිත වල නිෂ්පාදක වටිනාකම වැඩි වූයේ ප්‍රධාන වශයෙන්ම පොල් තෙල්වල නිෂ්පාදක මිල ඉහල යාම හේතු කොට ගෙනය. මාළුවල නිෂ්පාදක වටිනාකම ඉහළ ගියේ නිෂ්පාදිත මාළු ප්‍රමාණයෙහි මෙන්ම මාළුවල මිලෙහි ද වැඩිවීම හේතු කොටගෙනය. සහල් නිමැවුම වැඩිවීම හේතු කොට ගෙන සහල් වල නිෂ්පාදක වටිනාකම ද, සියයට 1·8 කින් වැඩිවිය. 1963 දී බුසල් කෝටි 4·92 ක්වූ මුළු සහල් නිමැවුම 1964 දී බුසල් කෝටි 5·05 දක්වා වැඩිවිය.

පෞද්ගලික හා රජයේ පාරිභෝජනය සහ ප්‍රාග්ධන සම්පාදනය ඇතුළත් වන දළ ජාතික වියදම් ඇස්තමේන්තු පවත්නා වෙළඳ මිල අනුව සකසා 11-අ (4) සංඛ්‍යා සටහනහි දක්වා ඇත. දළ ජාතික නිෂ්පාදනය හා අවක්‍ර බදු එකතු කිරීමෙන් සකසා ගන්නා ලද දළ ජාතික වියදම් පිළිබඳ ඇස්තමේන්තු 11 අ-5 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. මුළු දළ ජාතික වියදම රුපියල් කෝටි 701·26 සිට රුපියල් කෝටි 752·63 දක්වා වැඩිවිය. මෙය 1963 දී දළ ජාතික වියදමෙහි ඇති වූ සියයට 2·0 ක හා සසඳන විට සියයට 7·3ක වැඩිවීමෙකි.

මුළු ජාතික වියදමෙන් (දළ) සියයට 75 ක් පමණ වූ පෞද්ගලික පාරිභෝජන වියදම සියයට 8·8 කින් වැඩිවිය. ආනයනය කරන ලද පාරිභෝජන භාණ්ඩ ප්‍රමාණය අඩුවූ නිසා පෞද්ගලික පාරිභෝජනයෙහි වියදම දේශීය භාණ්ඩ හා සේවා සඳහා කැරුන වියදම වැඩිවීම නිසා ඇතිවූ පසුගිය වර්ෂයේ මෙන් නොව 1964 දී පාරිභෝජන වියදම වැඩිවූයේ ආනයනය කරන ලද භාණ්ඩ හා දේශීය භාණ්ඩ දෙවගයම හේතුකොට ගෙනය. 1963 දී ආනයන භාණ්ඩ හා සේවා සඳහා වූ පාරිභෝජන වියදම සියයට 10·1 කින් පහළ වැටුන අතර, මෙරට නිපැයුන භාණ්ඩ හා සේවා සඳහා වූ වියදම සියයට 11·0 කින් වැඩිවිය. 1964 ආනයනය භාණ්ඩ සඳහා වූ විය

---

* දුම්රිය, විදුලිය, වරාය, තැපැල් හා විදුලි පණිවුඩ සහ ලුණු දෙපාර්තමේන්තු.

† තාවකාලිකයි.

සංඛ්‍යා සටහන II (අ) 3

## දේශීය පාරිභෝජනය සඳහා මෙරට නිපද වූ භාණ්ඩ පවත්නා නිෂ්පාදිත මිල අනුව

| | රුපියල් දශ ලක්ෂ | | | | | | වෙනසෙහි සියයට ගණන | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1959න් 1960 ට | 1960න් 1961 ට | 1961න් 1962 ට | 1963න් 1962 ට | 1963න් 1964 ට |
| **1. කෘෂිකර්මය, දව ඇ. වන ද්‍රව්‍ය, පශු සම්පත හා ධීවර කර්මාන්තය** | | | | | | | | | | | |
| හාල් .. .. .. | 400 | 472 | 475 | 524 | 534 | 544 | + 18·2 | + 0·6 | + 10·4 | + 1·8 | + 1·8 |
| පොල් හා පොල් නිෂ්පාදිත * .. .. | 208 | 168 | 147 | 135 | 179 | 195 | — 19·4 | — 12·2 | — 8·2 | + 32·1 | + 9·2 |
| තේ * .. .. .. | 54 | 56 | 56 | 55 | 60 | 62 | + 4·3 | ... | — 1·8 | + 10·0 | + 2·3 |
| අනෙකුත් ආහාර භෝග .. .. .. | 327 | 350 | 382 | 382 | 390 | 411 | + 7·1 | + 9·3 | ... | + 2·1 | + 5·4 |
| දුම්කොළ .. .. .. | 14 | 15 | 19 | 21 | 22 | 23 | + 10·9 | + 23·7 | + 13·8 | + 3·3 | + 2·3 |
| බුලත් හා පුවක් .. .. .. | 34 | 37 | 38 | 34 | 36 | 33 | + 7·3 | + 1·6 | — 8·3 | + 4·7 | — 7·2 |
| දර .. .. .. | 14 | 14 | 15 | 15 | 15 | 16 | + 3·7 | + 3·5 | + 2·7 | + 2·7 | + 2·6 |
| පශු සම්පත .. .. .. | 142 | 134 | 139 | 136 | 150 | 156 | — 5·6 | + 4·3 | — 2·7 | + 10·4 | + 3·9 |
| මාළු .. .. .. | 60 | 69 | 86 | 101 | 125 | 137 | + 13·9 | + 25·3 | + 17·1 | + 24·4 | + 9·6 |
| විවිධ කෘෂිකර්ම හා වන ද්‍රව්‍ය නිෂ්පාදන .. | 49 | 52 | 53 | 55 | 59 | 62 | + 5·1 | + 2·9 | + 2·6 | + 7·5 | + 5·8 |
| පාවිච්චි කළ ආනයන භාණ්ඩ හැර (අ) .. .. | –25 | –25 | –25 | –33 | –40 | –44 | | | | | |
| දේශීය නිෂ්පාදන නිසා එකතුවූ වටිනාකම .. | 1,276 | 1,341 | 1,385 | 1,426 | 1 531 | 1,594 | + 5·1 | + 3·3 | + 2·9 | + 7·3 | + 4·1 |
| **2. කර්මාන්ත (ප්‍රාග්ධන සම්පාදනය අන්හැර)** | | | | | | | | | | | |
| කම්හල් කර්මාන්ත .. .. .. | 314 | 379 | 416 | 454 | 595 | 647 | + 20·8 | + 9·8 | + 9·0 | + 31·1 | + 8·7 |
| ගෘහ කර්මාන්ත .. .. .. | 110 | 113 | 116 | 119 | 127 | 131 | + 2·5 | + 2·9 | + 2·9 | + 6·6 | + 3·0 |
| පාවිච්චි කළ ආනයන භාණ්ඩ හැර (අ) .. .. | –168 | –187 | –191 | –167 | –238 | –245 | | | | | |
| දේශීය නිෂ්පාදන නිසා එකතු වූ වටිනාකම .. | 255 | 305 | 342 | 406 | 484 | 533 | + 19·3 | + 12·1 | + 19·0 | + 19·1 | + 10·0 |

(අ) වෙළෙඳ වටිනාකම අනුව

* තේ හා පොල් සඳහා ඇස්තමේන්තු සකස් කර ඇත්තේ ඒක ජන පාරිභෝජනය පිළිබඳ සංඛ්‍යා තොරතුරු පදනම් කරගෙනය. 1959 සිට 1962 දක්වා වූ වර්ෂ සඳහා ඇස්තමේන්තු සකස් කිරීම සඳහා 1953 පාරිභෝගික අය වැය සමීක්ෂණයෙන් සංඛ්‍යා තොරතුරු ලබාගන්නා ලද අතර 1963 සහ 1964 සඳහා ඇස්තමේන්තු සකස් කිරීමේදී 1963 පාරිභෝගික අයවැය සමීක්ෂණයෙන් සංඛ්‍යා තොරතුරු ලබාගන්න ලදි. මේ අනුව 1963 සහ 1964 සඳහාවූ ඇස්තමේන්තු ඊට පෙර වර්ෂවල ඇස්තමේන්තු සමග කොහෙත්ම සැසඳෙන්නේ නොවේ.

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුව
සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව
කර්මාන්ත දෙපාර්තමේන්තුව
ධීවර දෙපාර්තමේන්තුව

## සංඛ්‍යා සටහන II (අ) 4

## දළ-ජාතික වියදම් පවත්නා වෙළඳ මිල අනුව

| | රුපියල් දශ ලක්ෂ | | | | | | වෙනසේ සියයට ගණන | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1959න් 1960 ට | 1960ෆ 1961 ට | 1961න් 1962 ට | 1962න් 1963ට | 1963න් 1964 ට |
| **1. පෞද්ගලික පාරිභෝජනය** | | | | | | | | | | | |
| අ භාණ්ඩ හා සාධක නොවන සේවා ආනයන | | | | | | | | | | | |
| (i) ආහාර හා අනෙකුත් පෞද්ගලික පාරිභෝජන භාණ්ඩ ආනයන (අ) .. | 1,817 | 1,913 | 1,718 | 1,751 | 1,561 | 1,765 | + 5·3 | —10·2 | + 2·0 | —10·9 | +13·3 |
| (ii) සාධක නොවන සේවා ආනයන එකතුව .. | 178 | 152 | 137 | 128 | 129 | 99 | —14·5 | —10·0 | — 6·4 | + 0·9 | —23·0 |
| එකතුව .. | 1,995 | 2,065 | 1,854 | 1,879 | 1,690 | 1,867 | + 3·5 | —10·2 | + 1·3 | —10·1 | +10·5 |
| (ආ) මෙරට නිපදවන භාණ්ඩ (අ) හා සේවා | | | | | | | | | | | |
| (i) මෙරට නිපදවන භාණ්ඩ* .. | 2,093 | 2,208 | 2,282 | 2,416 | 2,650 | 2,806 | + 5·5 | + 3·4 | + 5·9 | + 9·7 | + 5·9 |
| (ii) ගෙවල් කුලී .. | 186 | 197 | 216 | 226 | 247 | 264 | + 5·9 | + 9·7 | + 4·3 | + 9·6 | + 6·9 |
| (iii) ප්‍රවාහණය හා පණිවුඩ හුවමාරුව .. | 241 | 256 | 272 | 286 | 294 | 343 | + 6·2 | + 6·4 | + 4·9 | + 2·8 | +16·6 |
| (iv) සේවා අන්තැනක නොසඳහන් .. | 467 | 475 | 488 | 506 | 524 | 544 | + 1·6 | + 2·8 | + 3·6 | + 3·7 | + 3·7 |
| රජයේ විලට ගැනුම් හැර .. | —110 | — 41 | —102 | —133 | — 50 | — 50 | | | | | |
| එකතුව .. | 2,878 | 3,095 | 3,157 | 3·301 | 3,665 | 3,907 | + 7·5 | + 2·0 | + 4·6 | +11·0 | + 6·6 |
| (ඇ) අනේවාසිකයන් විසින් මිලයට ගත් භාණ්ඩ හා සේවා හැර .. | —195 | —169 | —162 | —170 | —171 | —132 | | | | | |
| මුළු පෞද්ගලික පාරිභෝජනය .. | **4,678** | **4,991** | **4,849** | **5,010** | **5,184** | **5,641** | **+ 6·7** | **— 2·9** | **+ 3·3** | **+ 3·5** | **+ 8·8** |
| **2. රජයේ පාරිභෝජනය** | | | | | | | | | | | |
| (i) භාණ්ඩ හා සේවා සඳහා වර්ථන වියදම් මහ ආණ්ඩුව .. | 771 | 803 | 831 | 880 | 906 | 980 | + 4·1 | + 3·5 | + 5·8 | + 3·0 | + 8·2 |
| (ii) භාණ්ඩ හා සේවා සඳහා වර්තන වියදම් පලාත් ආණ්ඩු සභා .. | 90 | 87 | 74 | 78 | 83 | 88 | — 3·4 | —15·0 | + 5·8 | + 5·9 | + 5·8 |
| (iii) රජයේ ගොඩනැගිලි සඳහ ආරෝපිත කුලී | 20 | 21 | 21 | 22 | 22 | 23 | + 5·0 | + 0·5 | + 2·4 | + 2·3 | + 2·3 |
| එකතුව .. | **881** | **911** | **926** | **979** | **1,011** | **1,090** | **+ 3·4** | **+ 1·7** | **+ 5·7** | **+ 3·2** | **+ 7·9** |
| **3. දළ-දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය** | | | | | | | | | | | |
| (i) රජයේ .. | 256 | 238 | 249 | 260 | 257 | 239 | — 7·2 | + 4·9 | + 4·2 | — 1·2 | — 7·0 |
| (ii) රජයේ ව්‍යාපාර .. | 80 | 79 | 92 | 104 | 127 | 102 | — 0·3 | +15·5 | +13·1 | +22·8 | —20·0 |
| (iii) පෞද්ගලික අංශය හා රජයේ සමායතන .. | 733 | 649 | 637 | 668 | 607 | 682 | —11·5 | — 1·9 | + 4·9 | — 9·2 | +12·4 |
| එකතුව .. | **1,069** | **966** | **978** | **1,031** | **991** | **1,023** | **— 9·7** | **+ 1·2** | **+ 5·5** | **— 4·0** | **+ 3·2** |
| **4. තොග වෙනස්වීම්** | | | | | | | | | | | |
| (i) රජයේ (ii) රජයේ ව්‍යාපාර } ආ | — 22 | — 14 | + 54 | + 40 | + 5 | — 5 | | | | | |
| (iii) පෞද්ගලික අංශය හා රජයේ සමායතන (ඇ) .. | + 12 | — 31 | + 16 | — 41 | + 3 | — 36 | | | | | |
| එකතුව .. | **— 10** | **— 45** | **+ 69** | **— 1** | **+ 8** | **— 40** | | | | | |
| **5. දළ-දේශීය වියදම් (ඈ)** .. | **6,618** | **6,823** | **6,822** | **7,020** | **7,193** | **7,714** | **+ 3·1** | **...** | **+ 2·9** | **+ 2·5** | **+ 7·2** |
| **6. පිටරට ශුද්ධ ආයෝජන(ඉ)** | **—208** | **—221** | **— 94** | **—140** | **—168** | **—148** | | | | | |
| **7. ජාත්‍යන්තර, ත්‍යාග හා ප්‍රේෂණ වලින් ලැබීම් (ශුද්ධ) හැර** .. | **+ 12** | **— 22** | **— 11** | **— 7** | **— 13** | **— 40** | | | | | |
| **8. දළ-ජාතික වියදම** .. | **6,421** | **6,581** | **6,717** | **6,873** | **7,013** | **7,526** | **+ 2·5** | **+ 2·1** | **+ 2 3** | **+ 2·0** | **+ 7·3** |

(අ) සිල්ලර වටිනාකම අනුව

සංඛ්‍යා: II අ-2 සංඛ්‍යා සටහනේ සංලක්ෂ්‍යයන් බලන්න.

(ආ) ආනයන කළ හාල්, තිරිඟු පිටි හා සීනි, සහතික මිලට ගත් වී, හා අරක්කු වල තොග වෙනස්වීම පමණකි.

(ඇ) තේ, රබර් සහ පශු සම්පත් තොග වෙනස්වීම් පමණයි.

(ඈ) පාරිභෝජන වියදම්, දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය (– දළ –) සහ තොග වෙනස්වීම් පමණයි.

(ඉ) පිටරට ශුද්ධ ආයෝජන=මෙරට වර්තන ගිණුම් අතිරික්තය.

* තේ හා පොල් ඇස්තමේන්තු සකස් කර ඇත්තේ ඒක ජන පරිභොජනය පිළිබඳ සංඛ්‍යා තොරතුරු පදනම් කර ගෙනය. 1959 සිට 1962 දක්වා වූ වර්ෂ සඳහා ඇස්තමේන්තු සකස් කිරීම සඳහා 1953 පාරිභෝගික අයවැය සමීක්ෂණයෙන් සංඛ්‍යා තොරතුරු ලබා ගන්නා ලද අතර, 1963 සහ 1964 සඳහා ඇස්තමේන්තු 1963 පාරිභෝගික අයවැය සමීක්ෂණයෙන් සංඛ්‍යා තොරතුරු ලබා ගන්නා ලදී. මේ අනුව 1963 සහ 1964 සඳහා වූ ඇස්තමේන්තු ඊට පෙර වර්ෂවල ඇස්තමේන්තු සමග කොහෙත්ම සැසඳෙන්නේ නොවේ.

සංඛ්‍යා සටහන II (අ) 5

# දළ - ජාතික නිෂ්පාදිත වියදම් පවත්නා මිල අනුව

රුපියල් දශ ලක්ෂ

| | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 |
|---|---|---|---|---|---|---|
| 1. දළ- ජාතික නිෂ්පාදිතය-සාධක මිල අනුව .. .. | 5,854 | 6,080 | 6,142 | 6,418 | 6,716 | 7,121 |
| 2. අනියම් බදු (අ) ආධාර අඩු කොට .. .. | 389 | 413 | 390 | 472 | 458 | 420 |
| 3. දළ- ජාතික නිෂ්පාදිතය වෙළෙඳ මිල අනුව .. .. | 6,243 | 6,493 | 6,532 | 6,890 | 7,175 | 7,541 |

| | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 |
|---|---|---|---|---|---|---|
| 4. පාරිභෝජන වියදම පෞද්ගලික .. | 4,678 | 4,991 | 4,849 | 5,010 | 5,184 | 5,641 |
| 5. පාරිභෝජන වියදම රජයේ .. .. | 881 | 911 | 926 | 979 | 1,011 | 1,090 |
| 6. දළ දේශිය ප්‍රාග්ධන සම්පාදනය පෞද්ගලික අංශය සහ රජයේ සමායතන .. .. .. | 745 | 618 | 652 | 627 | 610 | 646 |
| 7. දළ-දේශිය ප්‍රාග්ධන සම්පාදනය රජයේ හා රජයේ ව්‍යාපාර .. .. | 314 | 303 | 395 | 403 | 389 | 336 |
| 8. දළ දේශිය වියදම (ආ) .. .. | 6,617 | 6,823 | 6,822 | 7,020 | 7,193 | 7,714 |
| 9. භාණ්ඩ හා සාධක නොවන සේවා අපනයන .. .. . | 2,016 | 2,011 | 1,907 | 1,971 | 1,903 | 1,933 |
| 10. භාණ්ඩ හා සාධක නොවන සේවා ආනයන හැර .. .. | –2,176 | –2,209 | –1,972 | –2,070 | –2,031 | –2,086 |
| 11. දළ-දේශිය නිෂ්පාදිත වියදම්-වෙළෙඳ මිල අනුව .. .. .. | 6,457 | 6,625 | 6,757 | 6,921 | 7,065 | 7,561 |
| 12. පිටරටින් ලැබුන සාධක ආදයම-ශුද්ධ .. | – 37 | – 44 | – 40 | – 47 | – 53 | – 34 |
| 13. ඉතිරි: තොගවල නොදත් වෙනස්කම් හා සංඛ්‍යා විෂමතා .. .. .. | –177 | – 88 | –185 | + 16 | +163 | +14 |
| 14. **දළ-ජාතික නිෂ්පාදිත වියදම වෙළෙඳ මිල අනුව (ඇ)** .. | 6,243 | 6.493 | 6.532 | 6.890 | 7,175 | 7,541 |

සාධ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

(අ) පලාත් ආණ්ඩු සහා බදු අයත් වෙයි.

(ආ) පාරිභෝගික වියදම හා දළ ජාතික ප්‍රාග්ධන සම්පාදන වියදම් සමාන වෙයි.

(ඇ) මේ සංඛ්‍යා සටහනෙහි–ශීර්ෂ 11 සහ 12 විජත යෛක්‍යය දළ ජාතික වියදමට සමානය. මෙය මේ සංඛ්‍යා සටහනේ 14 වැනි ශීර්ෂයට වඩා වෙනස් වන්නේ (දළ ජාතික නිෂ්පාදිත වියදම් (II (අ) 3 සංඛ්‍යා සටහනේ 8 ශීර්ෂය) වෙළෙඳ මිල අනුව 13 වැනි ශීර්ෂයේ දක්වා ඇති ප්‍රමාණයෙන් පමණකි. (තොගවල නොදත් වෙනස්කම් හා සංඛ්‍යා විෂමතා).

දම සියයට 10·5 කින් ඉහළ ගිය අතර, දේශීය භාණ්ඩ හා සේවා සඳහා වියදම් සියයට 6·6 කින් වැඩිවිය. 1963 දී සියයට 3·2 කින් වැඩිවූ රජයේ පාරිභෝජනය 1964 දී සියයට 7·9 කින් වැඩිවිය. ඉහත සඳහන් කළ පරිදි 1964 වියදම වැඩිවූයේ රජයේ වැටුප් හා විශ්‍රාම වැටුප් සඳහා වැය වැඩිවීමෙන් බව පිළිබිඹු වෙයි. 1963 දී රුපියල් කෝටි 4·07 කින් පහත වැටුනු ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය 1964 දී රුපියල් කෝටි 3·19 කින් හෙවත් සියයට 3·2 කින් වැඩිවිය. එසේ වුවද, තොග රුපියල් කෝටි 4·04 කින් පහළ වැටිනි. මේ හේතුවෙන් 1963 සියයට 3·0 කින් පහත වැටුනු මුළු ප්‍රාග්ධන සම්පාදනය 1964 දී පහත වැටුනේ සියයට 1·7 කිනි. පාරිභෝජන වියදමෙහි සහ ප්‍රාග්ධන සම්පාදනය 1964 දී පහත වැටුනේ සියයට 1·7 කිනි. පාරිභෝජන වියදමෙහි සහ ප්‍රාග්ධන සම්පාදනයෙහි එකතුව, එනම් මුළු දේශීය වියදම (දළ) 1964 දී සියයට 7·2 කින් වැඩිවිය.

ආනයනය කරන ලද හා මෙරට නිපැයුන භාණ්ඩ හා සේවා යන දෙවර්ගය යටතේ පෞද්ගලික පාරිභෝජන වියදම් පිළිබඳ විස්තර, පවත්නා වෙළඳ මිල අනුව සකස 11 (අ) – 6 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. ආනයනය කරන ලද සහල් පිටි හා සීනි සඳහා වූ වියදම් 1963 දී සියයට 2·6 කින් අඩු වුවද, 1964 දී සියයට 0·2 කින් වැඩි වූයේය. 1963 සියයට 14·6 කින් පහල වැටුන අනෙකුත්, ආනයන පාරිභෝජන භාණ්ඩ සඳහා වූ වියදම 1964 දී සියයට 20·0 කින් ඉහළ ගියේය. මෙ රට නිපදවන භාණ්ඩ සඳහා වූ වියදම් සියයට 5·9 කින් වැඩිවිය. පොල් නිෂ්පාදිත හා දර සඳහා වූ වියදම 1964 දී පිළිවෙලින් සියයට 10·5කින් හා සියයට 6·0කින් වැඩි විය. සිල්ලරට දෙන මිලෙහි ඇතිවූ වැඩිවීම මින් පිළිබිඹු වෙයි. සේවාවන් සම්බන්ධයෙන් ප්‍රවාහන සේවා වියදම සියයට 16·6 කින් වැඩිවී ඇත. මෙයින් ප්‍රධාන වශයෙන්ම මේ වර්ෂය තුළ පොදු ප්‍රවාහන සේවා පාවිච්චියෙහි ඇතිවූ වර්ධනය පිළිබිඹු වෙයි.

ප්‍රාග්ධන සම්පාදනය පිළිබඳ විස්තර II(අ)-7 සංඛ්‍යා සටහනෙහි දක්වේ. ඉහත සඳහන් කළ පරිදි පෞද්ගලික අංශයේ ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය වැඩිවීමෙන් විශාල වශයෙන්ම පිළිබිඹු වූයේ ගොඩනැගිලි හා අනෙකුත් ඉදිකිරීම් සහ යන්ත්‍රෝප කරණ සඳහා ප්‍රාග්ධන සම්පාදනය පිළිවෙලින් සියයට 26·3කින් හා සියයට 14·7 කින් වැඩිවීමය. 1963 දී යන්ත්‍රෝපකරණ සඳහා වූ ප්‍රාග්ධන සම්පාදනය සියයට 36·0 කින් වැඩි වුවද, ගොඩනැගිලි හා අනෙකුත් ඉදිකිරීම් සඳහා වූ ප්‍රාග්ධන සම්පා ධනය සියයට 23·5 කින් අඩුවිය. ප්‍රාග්ධන සම්පාදනය පිළිබඳ ඇස්තමේන්තු සකස් කැරෙන්නේ ප්‍රාග්ධන භාණ්ඩ ආනයන පදනම් කරගෙනය. එබැවින් ප්‍රාග්ධන සම්පාදනයේ වෙනස්වීම් වලින් පිළිබිඹු කැරෙන්නේ ප්‍රාග්ධන භාණ්ඩ ආනයනයේ සිදුවූ වෙනස් වීමය. 1964 දී පෞද්ගලික අංශයේ මුළු ප්‍රාග්ධන සම්පා දනය සියයට 5·9 කින් වැඩි වුවද, ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය සියයට 12·4 කින් වැඩිවිය. මුළු ප්‍රාග්ධන සම්පාදනය වැඩිවීමේ අනුපාතිකය සහ ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනයේ වෙනසට තේ සහ රබර් තොගවල ප්‍රමාණයන් රුපියල් කෝටි 3·57 කින් අඩුවීම හේතු වෙයි.

රාජ්‍ය අංශයෙහි පොදු ව්‍යවසායන් විසින් කැරුන ස්ථාවර ප්‍රාග්ධන සම්පාද නය මෑත වර්ෂ වලදී අඛණ්ඩව වැඩිවෙමින් පැවතුන නමුත්, 1964 දී එය සියයට 20·0 කින් පහළ වැටුනේය. රජයේ අනෙකුත් දෙපාර්තමේන්තු විසින් කැරුන ප්‍රාග්ධන සම්පාදනයද සියයට 7·0කින් පහල වැටින. රාජ්‍ය සංස්ථා හැර රාජ්‍ය අංශය සමස්තයක් වශයෙන් ගත් කල එහි ප්‍රාග්ධන සම්පාදනය සියයට 11·3 කින් පහත වැටින. රාජ්‍ය අංශයෙහිද තොග රුපියල් කෝටි 0·47කින් අඩුවිය. රාජ්‍ය අංශයේ ප්‍රාග්ධන සම්පාදනය තොගද ඇතුළුව 1964 දී සියයට 13·6කින් පහළ වැටින. පසුගිය වර්ෂයේ එය පහළ වැටුනේ සියයට 3·6 කිනි.

සංඛ්‍යා II (අ) 6

## පෞද්ගලික පාරිභෝජන වියදම් සැකැසුම–පවත්නා වෙළෙඳ මිල අනුව

| | රුපියල් දශ ලක්ෂ | | | | | | වෙනසෙහි සියයට ගණන | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1959න් 1960 ට | 1960න් 1961 ට | 1961න් 1962 ට | 1962න් 1963 ට | 1963න් 1964 ට |
| අ. භාණ්ඩ හා සාධක නොවන ආයතනය | | | | | | | | | | | |
| (i) සහල්, තිරිඟු පිටි සහ සීනි .. | 490 | 488 | 522 | 545 | 531 | 532 | — 0·3 | + 7·0 | + 4·4 | — 2·6 | + 0·2 |
| (ii) අනෙක් පෞද්ගලික පාරිභෝජන භාණ්ඩ .. | 1,328 | 1,425 | 1,196 | 1,206 | 1,030 | 1,236 | + 7·3 | —16·1 | + 0·9 | —14·6 | +20·0 |
| (iii) සාධක නොවන සේවා .. | 178 | 152 | 137 | 128 | 129 | 99 | —14·5 | —10·0 | — 6·4 | + 0·9 | —23·0 |
| එකතුව | 1,995 | 2,065 | 1,854 | 1,879 | 1,690 | 1,867 | + 3·5 | —10·2 | + 1·3 | —10 1 | +10·5 |
| ආ. මෙරට නිපදවුනු භාණ්ඩ හා සේවා | | | | | | | | | | | |
| (i) මෙරට නිපදවුනු භාණ්ඩ .. | | | | | | | | | | | |
| හාල් .. .. | 312 | 308 | 275 | 306 | 319 | 312 | — 1·5 | —10·6 | +11·2 | + 4·4 | — 2·1 |
| පොල් නිෂ්පාදිත* .. | 232 | 187 | 162 | 154 | 210 | 232 | —19·4 | —13·4 | — 4·8 | +35·8 | +10·5 |
| තේ* .. .. | 63 | 67 | 69 | 70 | 78 | 79 | + 7·5 | + 2·2 | + 1·7 | +11·6 | + 0·5 |
| අනෙකුත් ආහාර භෝග .. | 398 | 433 | 473 | 473 | 483 | 509 | + 8·6 | + 9·4 | ... | + 2·1 | + 5·3 |
| දුම්කොළ .. .. | 20 | 22 | 27 | 31 | 32 | 32 | +11·3 | +24·0 | +13 8 | + 2·9 | + 2·5 |
| බුලත්, පුවක් .. .. | 46 | 50 | 50 | 46 | 48 | 45 | + 7·1 | + 1·8 | — 8·3 | + 4·5 | — 7·3 |
| දර .. .. | 15 | 16 | 17 | 17 | 17 | 18 | + 3·9 | + 3 8 | + 3·0 | — 1·2 | + 6·0 |
| පශු සම්පත .. .. | 174 | 168 | 184 | 181 | 190 | 196 | — 3·3 | + 9·3 | — 1·8 | + 5·0 | + 3·1 |
| මාළු .. .. | 80 | 92 | 115 | 134 | 167 | 179 | +13·9 | +25·5 | +17·0 | +24·5 | + 7·2 |
| විවිධ කෘෂිකාර්මික දූව ඇ වන ද්‍රව්‍ය .. .. | 57 | 59 | 61 | 61 | 67 | 81 | + 4·6 | + 3·4 | — 0·7 | + 9·9 | +20·8 |
| කාර්මික නිෂ්පාදිත .. | 696 | 808 | 849 | 942 | 1,040 | 1,125 | +16·0 | + 5·2 | +10·9 | +10·4 | + 8·1 |
| එකතුව .. .. | 2,093 | 2,208 | 2,282 | 2,416 | 2,650 | 2,806 | + 5·5 | + 3·4 | + 5·9 | + 9·7 | + 5·9 |
| (ii) ගෙවල් කුලී .. .. | 186 | 197 | 216 | 226 | 247 | 264 | + 5·9 | + 9·7 | + 4·3 | + 9·6 | + 6·9 |
| (iii) ප්‍රවාහණය හා පණිවුඩ හුවමාරුව .. | 241 | 256 | 272 | 286 | 294 | 343 | + 6·2 | + 6·4 | + 4·9 | + 2·8 | +16·6 |
| (iv) සේවා (අන් තැනක නොසඳහන්) | | | | | | | | | | | |
| පුද්ගලයන්ට කරන ලද මූල්‍ය සේවා .. | 13 | 14 | 15 | 16 | 18 | 19 | + 8·5 | + 7·1 | + 8·0 | +10·5 | + 7·8 |
| ක්‍රීඩා සහ විනෝද .. | 24 | 25 | 26 | 27 | 28 | 29 | + 3·3 | + 3·2 | + 2·7 | + 3·7 | + 3·2 |
| ගෘහ සේවා .. .. | 200 | 203 | 209 | 218 | 227 | 236 | + 1·5 | + 3·1 | + 4·0 | + 4·0 | + 4 1 |
| හෝටල් සහ ආපන ශාලා .. | 119 | 121 | 125 | 130 | 135 | 140 | + 1·5 | + 3·1 | + 4·0 | + 3·7 | + 4·3 |
| වෘත්තීය සහ ආනයන සේවා අන් තැනක නොසඳහන් (ආ) | 61 | 61 | 61 | 61 | 61 | 61 | ... | ... | ... | ... | ... |
| පෞද්ගලික සේවා අන් තැනක නොසඳහන් (ඇ) | 50 | 51 | 52 | 54 | 57 | 59 | + 1·4 | + 3·2 | + 4·0 | + 4·1 | + 4·1 |
| එකතුව .. .. | 467 | 475 | 488 | 506 | 524 | 544 | + 1·6 | + 2·8 | + 3·6 | + 3·7 | + 3·7 |
| රජය මෙරටින් මිලදී ගැනීම් හැර | —110 | — 41 | —102 | —133 | — 50 | — 50 | | | | | |
| මුළු එකතුව .. .. | 2,878 | 3,095 | 3,157 | 3,301 | 3,665 | 3,907 | + 7·5 | + 2·0 | + 4·6 | +11·0 | + 6·6 |
| ඇ. අනේවාසිකයන් විසින් මිලදී ගත්භාණ්ඩ හා සේවා හැර .. .. | —195 | —169 | —162 | —170 | —171 | —132 | | | | | |
| මුළු පෞද්ගලික පාරිභෝජනය .. | 4,678 | 4,991 | 4,849 | 5,010 | 5,184 | 56,41 | + 6·7 | — 2·9 | + 3·3 | + 3·5 | + 8 8 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

(අ) ව්‍යාපාර වලින් බාහිරව, බැංකු,රක්ෂණ සමාගම් සහ අනෙකුත් මූල්‍ය ආනයන විසින් ගෙවැසියනට කරන ලද සේවාවන්ගේ වටිනාකම.

(ආ) පෞද්ගලික වෛද්‍ය, නීති හා අධ්‍යාපනික සේවා සහ ලාභ නොලපයන පුද්ගල මණ්ඩල (ආගමික සහ සුභ සාධක සංවිධාන, සහ වාණිජ සමිති ආදිය) වලින් කරන ලද සේවා.

(ඇ) ඩෝබි, බාබර්, වෛද්‍ය සහ අවමඟුල් කටයුතු භාර ගන්නන් විසින් කරන ලද සේවා.

* තේ හා පොල් සඳහා ඇස්තමේන්තු සකස්කර ඇත්තේ ඒකජන පරිභෝජනය පිළිබඳ සංඛ්‍යා තොරතුරු පදනම් කරගෙනය. 1959 සිට 1962 දක්වා වූ වර්ෂ සඳහා ඇස්තමේන්තු සකස් කිරීම සඳහා 1953 පාරිභෝගික අයවැය සමීක්ෂණයෙන් සංඛ්‍යා තොරතුරු ලබා ගන්නා ලද අතර, 1963 සහ 1964 සඳහා ඇස්තමේන්තු සකස් කිරීම සඳහා 1963 පාරිභෝගික අයවැය සමීක්ෂණයෙන් සංඛ්‍යා තොරතුරු ලබා ගන්නා ලදී. මේ අනුව 1963 සහ 1964 සඳහා වූ ඇස්තමේන්තු ඊට පෙර වර්ෂ වල ඇස්තමේන්තු සමග කොහෙත්ම සැසඳෙන්නේ නොවේ.

## සංඛ්‍යා සටහන II (අ) 7

## දළ-ජාතික ප්‍රාග්ධන සම්පාදනය - පවත්නා වෙළඳ මිල අනුව

| | රුපියල් දශ ලක්ෂ | | | | | | වෙනසේ සියයට ගණන | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1960න් 1959 ට | 1961න් 1960 ට | 1962න් 1961 ට | 1963න් 1962 ට | 1964න් 1963 ට |
| අ. පෞද්ගලික අංශය සහ රජයේ සමායතන | | | | | | | | | | | |
| (i) දළ-දේශිය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | | | | | | | | | | | |
| වගාකිරීම හා නැවත වගාකිරීම .. | 62 | 63 | 63 | 64 | 70 | 70 | + 1·8 | ... | + 1·3 | + 8·6 | + 0·7 |
| ගොඩනැගිලි සහ අනෙකුත් සමහර ඉදි කිරීම් .. | 336 | 341 | 320 | 342 | 262 | 331 | + 1·5 | — 6·0 | + 6·8 | —23·5 | +26·3 |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ .. | 119 | 77 | 113 | 113 | 154 | 177 | —35·1 | +47·5 | — 0·2 | +36·0 | +14·7 |
| ප්‍රවාහනය .. | 153 | 109 | 85 | 92 | 63 | 50 | —28·9 | —21·8 | + 8·4 | —31·7 | —20·2 |
| ආනයන කළ ප්‍රාග්ධන භාණ්ඩ (අන් තැනෙක නොසඳහන්) .. | 64 | 59 | 55 | 57 | 59 | 55 | — 7·5 | — 7·4 | + 3·1 | + 3·5 | — 6·8 |
| එකතුව .. | 733 | 649 | 637 | 668 | 607 | 682 | —11·5 | — 1·9 | + 4·9 | — 9·2 | +12·4 |
| (ii) තොග වෙනස්වීම | | | | | | | | | | | |
| තේ .. | + 1 | — 13 | — 3 | — 37 | — 17 | — 24 | | | | | |
| රබර් .. | — 3 | — 27 | + 19 | + 3 | + 20 | — 12 | | | | | |
| පශු සම්පත් . | + 13 | + 9 | ... | — 7 | ... | ... | | | | | |
| එකතුව .. | + 12 | — 31 | + 16 | — 41 | + 3 | — 36 | | | | | |
| ජාතික ප්‍රාග්ධන සම්පාදනය .. | 745 | 618 | 652 | 627 | 610 | 646 | —17·0 | + 5·5 | — 3·9 | — 2·6 | + 5·9 |
| ආ. රාජ්‍ය සහ පොදු ව්‍යාපාර | | | | | | | | | | | |
| (i) දළ දේශිය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය .. | 336 | 317 | 341 | 364 | 384 | 341 | — 5·6 | + 7·6 | + 6·6 | + 5·6 | —11·3 |
| (ii) තොග වෙනස්වීම | | | | | | | | | | | |
| ආනයනය කළ හාල්-තිරිඟු පිටි හා සීනි .. | + 13 | — 26 | — 12 | — 2 | ... | — 5 | | | | | |
| සහතික මිලට ගත් වී · | — 35 | + 10 | + 65 | + 45 | + 10 | ... | | | | | |
| අරක්කු .. | ... | + 2 | ... | — 3 | — 5 | ... | | | | | |
| එකතුව .. | — 22 | — 14 | + 54 | + 40 | + 5 | — 5 | | | | | |
| දළ ජාතික ප්‍රාග්ධන සම්පාදනය .. | 314 | 303 | 395 | 403 | 389 | 336 | — 3·6 | +30·4 | + 2·2 | — 3·6 | —13·6 |
| ඇ. සියලුම අංශ | | | | | | | | | | | |
| (i) දළ-දේශිය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය .. | 1,069 | 966 | 978 | 1,031 | 991 | 1,023 | — 9·7 | + 1·2 | + 5·5 | — 4·0 | + 3·2 |
| (ii) තොග වෙනස්වීම .. | — 10 | — 45 | + 69 | — 1 | + 8 | — 40 | | | | | |
| ජාතික ප්‍රාග්ධන සම්පාදනය .. | 1,059 | 921 | 1,047 | 1,030 | 999 | 982 | —13·0 | +13·7 | — 1·6 | — 3·0 | — 1·7 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

**තිබෙන සම්පත් මාර්ග හා ප්‍රයෝජන**

නිෂ්පාදන හා ආනයන මාර්ගයෙන් රටට ලබා ගැනීමට හැකිවූ සම්පත් මාර්ග සහ ඒවා පාරිභෝජනය, ප්‍රාග්ධන සම්පාදනය හා අපනයන සඳහා උපයෝගී කර ගත් ආකාරය II අ-8 සංඛ්‍යා සටහනෙහි දැක්වේ. නිෂ්පාදනය මාර්ගයෙන් ලැබෙන සම්පත් මාර්ග 1960 සිට ශීඝ්‍රාකාරයෙන් වැඩිවෙමින් ඇති බැව් මෙම සංඛ්‍ය සටහනින් පෙනී යයි. 1964 මෙම වැඩිවීමේ වේගය මෑත වර්ෂයේ නොවූ විරූ අන්දමට සියයට 7·0 දක්වා ඉහළ නැංගේය. ආනයන මාර්ගයෙන් ලබාගත හැකිවූ සම්පත්ද 1964 දී සියයට 7·7කින් වැඩිවිය. 1963 දී එය සියයට 1·9කින් අඩුවී ඇත.

සංඛ්‍යා සටහන II (අ) 8

**ධන මාර්ග සහ ඒ උපයෝගි කර ගැනීම - පවත්නා වෙළෙඳ මිල අනුව**

| | රුපියල් දශ ලක්ෂ | | | | | | වෙනසේ සියයට ගණන | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1959න් 60 ට | 1960න් 61 ට | 1961න් 62 ට | 1962න් 63 ට | 63 ට 64 න් |
| අ. ධන මාර්ග | | | | | | | | | | | |
| දළ ජාතික නිෂ්පාදිතය (1) .. | 6,457 | 6,625 | 6,757 | 6,920 | 7,064 | 7,561 | + 2·6 | + 2·0 | + 2·4 | + 2·1 | +7·0 |
| භාණ්ඩ සහ සාධක නොවන සේවා ආනයනය .. | 2,176 | 2,209 | 1,972 | 2,070 | 2,031 | 2,086 | + 1·5 | −10·7 | + 5·0 | − 1·9 | +2·7 |
| එකතුව .. | 8,633 | 8,834 | 8,729 | 8,990 | 9,095 | 9,647 | + 2·3 | − 1·2 | + 3·0 | + 1·2 | +6·1 |
| ආ. උපයෝගි කරගැනීම | | | | | | | | | | | |
| පාරිභෝජනය .. | 5,559 | 5,902 | 5,775 | 5,990 | 6,195 | 6,731 | + 6·2 | − 2·2 | + 3·7 | +3·4 | +8·7 |
| දළ-ජාතික ප්‍රාග්ධන සම්පාදනය .. | 1,059 | 921 | 1,047 | 1,030 | 999 | 982 | −13·0 | +13·7 | − 1·6 | − 3·0 | −1·7 |
| භාණ්ඩ සහ සාධක නොවන සේවා ආනයනය .. | 2,016 | 2,011 | 1,907 | 1,971 | 1,903 | 1,933 | − 0·3 | − 5·2 | + 3·4 | − 3·5 | +1·6 |
| එකතුව .. | 8,633 | 8,834 | 8,729 | 8,990 | 9,095 | 9,647 | + 2·3 | − 1·2 | + 3·0 | + 1·2 | +6·1 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

(අ) II (අ) 2 සංඛ්‍යා සටහනේ 3 වැනි ශීර්ෂය වන මෙය, වියදම් අංශයේ පාරිභෝජන හා ප්‍රාග්ධන සම්පාදන ඇස්තමේන්තු වලට සරිලන සේ, ආධාර හැර අනියම් බදු සඳහා ද (I (අ) 5 සංඛ්‍යා සටහනේ 2 වැනි ශීර්ෂය) නොගැලපෙන නොදත් වෙනස්කම් හා සංඛ්‍යා විෂමතා (II (අ) 5 සංඛ්‍යා සටහනේ 13 වැනි ශීර්ෂය)ද සමග ගලපා ඇත.

මුළු සම්පත් මාර්ග වලින් සියයට 70 ක් පාරිභෝජනය සඳහාද, සියයට 10 ක් ප්‍රාග්ධන සම්පාදනය සඳහා ද, සියයට 20 ක් අපනයන සඳහා ද බෙදී ගියේය. 1964 සම්පත් මාර්ග ප්‍රයෝජනයට ගත් ආකාරය අනුව පාරිභෝජනය සියයට 8·7කින් වැඩිවී ඇති අතර 1963 දී එය වැඩිවූයේ සියයට 3·4කිනි. ප්‍රාග්ධන සම්පාදනය සඳහා යොදවන ලද සම්පත් මාර්ග ප්‍රමාණය 1963 සහ 1964 යන දෙවර්ෂයේදීම අඩු විය. මෙය 1964 දී සියයට 1·7කින් පහළ වැටුන අතර, 1963 දී පහළ වැටුන ප්‍රමාණය සියයට 3·0ක් විය.

දැනට නිෂ්පාදනය වන සම්පත් වලින් දළ ජාතික වියදම් සඳහා කෙතෙක් දුරට මුදල් සපයන ලද්දේද යන්න හා කෙතෙක් දුරට අපගේ විදේශ ගත ධනයෙන් ප්‍රයෝජන ගැනීම සහ/හෝ විදේශ වගකීම් වැඩිකිරීම අවශ්‍ය වූයේද යන්න II (අ)-9 සංඛ්‍යා සටහනෙහි දැක්වේ. පසුගිය වර්ෂ කිහිපය තුළදී මෙන්ම 1964 දී ද දළ ජාතික වියදම, වර්තමාන නිෂ්පාදන වලින් ලබාගත හැකි සම්පත් ප්‍රමාණය ඉක්මවා ගියේය. එසේ ඉක්මවූ ප්‍රමාණය 1963 දී දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 2·6 ක් වූ අතර 1964 දී එය සියයට 2·5 ක් විය. 1964 දී එකී අධිකයෙන් කොටසක් රුපියල් කෝටි 14·8 ක නිරායෝජනයකින් එනම් අපගේ විදේශ වත්කම් ප්‍රයෝජන

සංඛ්‍යා සටහන II (අ) 9

## දළ - ජාතික වියදම සහ තිබෙන ධන මාර්ග පවත්නා වෙළඳ මිල අනුව

| | 1959 | | 1960 | | 1961 | | 1962 | | 1963 | | 1964 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රුපියල් දශ ලක්ෂ | 7 වැනි පෙළේ ප්‍රතිශතය | රුපියල් දශ ලක්ෂ | 7 වැනි පෙළේ ප්‍රතිශතය | රුපියල් දශ ලක්ෂ | 7 වැනි පෙළේ ප්‍රතිශතය | රුපියල් දශ ලක්ෂ | 7 වැනි පෙළේ ප්‍රතිශතය | රුපියල් දශ ලක්ෂ | 7 වැනි පෙළේ ප්‍රතිශතය | රුපියල් දශ ලක්ෂ | 7 වැනි පෙළේ ප්‍රතිශතය |
| 1 පාරිභෝජන වියදම: පෞද්ගලික .. .. | 4,678 | 72·9 | 4,991 | 75·8 | 4,849 | 72·2 | 5,010 | 72·9 | 5,184 | 73·9 | 5,641 | 74·9 |
| 2. පාරිභෝජන වියදම: රජයේ .. .. | 881 | 13·7 | 911 | 13·8 | 926 | 13·9 | 979 | 14·2 | 1,011 | 14·4 | 1,090 | 14·5 |
| 3. දළ-දේශීය ප්‍රාග්ධන සම්පාදනය: පෞද්ගලික අංශය රජයේ සමායතන .. | 745 | 11·6 | 618 | 9·4 | 652 | 9·7 | 627 | 9·1 | 610 | 8·7 | 646 | 8·6 |
| 4. දළ-දේශීය ප්‍රාග්ධන සම්පාදනය: රජයේ ව්‍යාපාර .. 5. දළ-දේශීය ප්‍රාග්ධන සම්පාදනය: රජයේ | 314 | 4·9 | 303 | 4·6 | 395 | 5·9 | 403 | 5·9 | 389 | 5·5 | 336 | 4·5 |
| 6. දළ-දේශීය වියදම .. | 6,618 | 103·1 | 6,823 | 103·7 | 6,822 | 101·5 | 7,020 | 102·1 | 7,193 | 102·6 | 7,714 | 102·5 |
| 7. ජාතික නිෂ්පාදිතය (ගලපා)* | 6,420 | 100·0 | 6,581 | 100·0 | 6,717 | 100·0 | 6,874 | 100·0 | 7,012 | 100·0 | 7,527 | 100·0 |
| 8. ශීර්ෂ (6) ශීර්ෂ (7) ට වැඩි කොටස ලැබුනේ- | | | | | | | | | | | | |
| (අ) පිටරට ආයෝජන (ශුද්ධ) අඩු කිරීමෙන් | 208 | | 221 | | 94 | | 140 | | 168 | | 148 | |
| (ආ) ජාත්‍යන්තර, ත්‍යාග හා ප්‍රේෂණ ලැබීමෙන් (ශුද්ධ) .. .. | — 12 | | + 22 | | + 11 | | + 7 | | + 13 | | +40 | |
| (අ) + (ආ) .. .. | 196 | | 243 | | 105 | | 147 | | 181 | | 188 | |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

* දළ ජාතික වියදම් පිළිබඳ සංඛ්‍යා සටහනින් (සංඛ්‍යා සටහන II (අ) 4) ගනු ලැබූ මේ සංඛ්‍යා සටහනේ දැක්වෙන අනෙකුත් ශීර්ෂ සමග ඒකාකාරීත්වයක් ඇති වනු සඳහා II (අ) 5 සංඛ්‍යා සටහනින් 3 වැනි ශීර්ෂය වශයෙන් දක්වා ඇති පවත්නා වෙළඳ මිල අනුව වූ දළ ජාතික නිෂ්පාදිත වියදම් සංඛ්‍යා එම සටහනේ 13 වැනි ශීර්ෂය සමග ගලපා ඇත.

## සංඛ්‍යා සටහන II (අ) 10

## (දළ) ජාතික වියදම් සැකැසුමේ අඩංගු ආනයන

| | 1959 | | | | 1960 | | | | 1961 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පෞද්ගලික පාරිභෝජනය | රජයේ පාරිභෝජනය | දළ දේශීය හා ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | තොග වෙනස්වීම | පෞද්ගලික පාරිභෝජනය | රජයේ පාරිභෝජනය | දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | තොග වෙනස්වීම | පෞද්ගලික පාරිභෝජනය | රජයේ පාරිභෝජනය | දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | තොග වෙනස්වීම |
| 1. වියදම (වෙළෙඳ මිල අනුව) (රු. දශ ලක්ෂ) .. | 4,678 | 881 | 1,069 | —10 | 4,991 | 911 | 965 | —45 | 4,849 | 926 | 978 | +69 |
| 2. ආනයන අඩංගුව (මි.ර.ගැ. මිල අනුව) | | | | | | | | | | | | |
| (අ) ප්‍රමාණය රු. දශ ලක්ෂ) | 1,426 | 82 | 365 | +13 | 1,365 | 120 | 336 | —26 | 1,166 | 65 | 306 | —12 |
| (ආ) සියයට ගණන .. | 30·5 | 9·3 | 34·1 | | 27·3 | 13·2 | 34·8 | | 24·0 | 7·0 | 31·3 | |
| 3. ආනයන අඩංගුව – වෙළෙඳ මිල අනුව * | | | | | | | | | | | | |
| (අ) ප්‍රමාණය (රු. දශ ලක්ෂ) | 1,995 | 84 | 565 | +15 | 2,065 | 122 | 519 | —28 | 1,854 | 67 | 473 | —14 |
| (ආ) සියයට ගණන .. | 42·6 | 9·5 | 52·9 | | 41·4 | 13·4 | 53·7 | | 38·2 | 7·2 | 48·4 | |

| | 1962 | | | | 1963 | | | | 1964 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පෞද්ගලික පාරිභෝජනය | රජයේ පාරිභෝජනය | දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | තොග වෙනස්වීම | පෞද්ගලික පාරිභෝජනය | රජයේ පාරිභෝජනය | දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | තොග වෙනස්වීම | පෞද්ගලික පාරිභෝජනය | රජයේ පාරිභෝජනය | දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන තොග වෙනස්වීම | තොග වෙනස්වීම |
| 1. වියදම (වෙළෙඳ මිල අනුව) (රු. දශ ලක්ෂ) .. | 5,010 | 979 | 1,031 | — 1 | 5,184 | 1,011 | 991 | + 8 | 5,641 | 1,090 | 1,023 | —40 |
| 2. ආනයන අඩංගුව (මි.ර.ගැ. මිල අනුව) | | | | | | | | | | | | |
| (අ) ප්‍රමාණය රු. දශ ලක්ෂ) | 1,104 | 52 | 310 | — 2 | 984 | 47 | 293 | ... | 1,422 | 37 | 295 | — 5 |
| (ආ) සියයට ගණන .. | 22·0 | 5·3 | 30·1 | | 19·0 | 4·6 | 29·6 | | 25·2 | 3·4 | 28·8 | |
| 3. ආනයන අඩංගුව – වෙළෙඳ මිල අනුව * | | | | | | | | | | | | |
| (අ) ප්‍රමාණය (රු. දශ ලක්ෂ) | 1,879 | 54 | 479 | — 4 | 1,690 | 49 | 466 | + 2 | 1,867 | 39 | 486 | — 7 |
| (ආ) සියයට ගණන .. | 37·5 | 5·5 | 46·5 | | 32·6 | 4·8 | 47·0 | | 33·1 | 3·6 | 47·5 | |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

* රජයේ (රාජ්‍ය ආරක්ෂක) ආනයන සහ ආනයන තොග වෙනස්වීම් අගය කොට ඇත්තේ මි.ර.ගැ. මිල අනුවය. ආනයන කළ අනෙකුත් සෑම වෙළෙඳ භාණ්ඩයක්ම සිල්ලර මිලට අගය කොට ඇත.

යට ගැනීමෙන් සහ/හෝ අපගේ විදේශ වගකීම් වැඩිකිරීමෙන්ද තවත් කොටසක් රුපියල් කෝටි 4·0 ක ජාත්‍යන්තර පරිත්‍යාග ලැබීමෙන්(ශුඩ)හා පැවරුම් වලින්ද පියවා ගනු ලැබීය. 1963 දී ඇතිවූ අධිකය රුපියල් කෝටි 16·8 ක නිරායෝජන යකින් හා රුපියල් කෝටි 1·3 ක ජාත්‍යන්තර පරිත්‍යාග ලැබීමකින් (ශුඩ) හා පැව රුම් වලින් පියවා ගනු ලැබින.

තවද මෙම සටහනේ පාරිභෝජනය හා ප්‍රාග්ධන සම්පාදනය සඳහා වූ වියදම දළ ජාතික නිෂ්පාදිතයන් සමග සසඳා ඇත. 1964 දී දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 89·4 කට සමාන ප්‍රමාණයක් පෞද්ගලික පාරිභෝජනය සඳහාද, සියයට 13·1 ක් ප්‍රාග්ධන සම්පාදනය සඳහා ද, යෙදවූ බැව් පෙනී යයි. 1963 දී දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 88·3 ක් පාරිභෝජනය සඳහා ද සියයට 14·2ක් ප්‍රාග්ධන සම්පාදනය සඳහා ද යොදවා ඇත.

රජයේ පාරිභෝජනයෙහි පෞද්ගලික පාරිභෝජනයෙහි හා මුළු ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනයෙහි අඩංගු ආන යන ප්‍රමාණය II [අ] – 10 වැනි සංඛ්‍යා සටහනෙහි දැක්වෙයි.

පෞද්ගලික පාරිභෝජනයෙහි අඩංගුවූ ආනයන වල වටිනාකම (මි. ර. ගැ. මිල අනුව) 1962 දී සියයට 22·0 ක් විය. 1963 දී එය සියයට 19·0 දක්වා පහළ වැටුන මුත්, 1964 දී සියයට 25·2 දක්වා වැඩිවූයේය. පෞද්ගලික පාරිභෝජනයෙහි අඩංගු වූ ආනයන වල වටිනාකම වෙළඳ මිල අනුව ද එයට සමාන ආකාරයකින් වෙනස් විය. 1962 හා 1963 අතර, කාලයේදී පාරිභෝගික භාණ්ඩ ආනයනය පහල වැටීමත් 1964 දී එයට ප්‍රතිවිරුඩව එය වැඩිවීමත් නිසා ඉහත වෙනස්වීම් බලාපොරොත්තු වූවකි.

ප්‍රාග්ධන සම්පාදනයෙහි අඩංගුවූ ආනයන වල මි. ර. ගැ. මිල අනුව වටිනාකම 1963 දී සියයට 29·6 ක්ව තිබී, 1964 දී සියයට 28·8 දක්වා පහළ වැටුන මුත්, වෙළඳ මිල අනුව වටිනාකම 1964 දී සියයට 47·0 සිට සියයට 47·5 දක්වා සුළු වශයෙන් වැඩිවිය.

## කාර්මික මූල අනුව දළ දේශීය නිෂ්පාදිතය

කාර්මික මූලයන් අනුව දළ දේශීය නිෂ්පාදිතය පවත්නා සාධක වියදම් මිල අනුව, II (අ)–11 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. 1964 දී දළ ජාතික නිෂ්පාදිතයේ වැඩිවිම කෘෂිකර්මාන්ත, පතල් හා ඉදිකිරීම් ඇතුළත් කර්මාන්ත හා සේවා යන අංග වල ඇතිවූ වර්ධනය නිසා ඇතිවිය. 1964 දී සේවා අංගයෙහි ශුද්ධ නිපැයුම සියයට 7·1 කින්ද, කර්මාන්ත අංගයෙහි ශුඩ නිපැයුම සියයට 5·1කින්ද, කෘෂිකර්මාන්ත අංගයෙහි ශුඩ නිපැයුම 4·6කින්ද වැඩිවිය.

## මූර්ත නිෂ්පාදිතය, මූර්ත ආදායම හා මූර්ත වියදම්

1959 ස්ථාවර මිල අනුව දළ ජාතික නිෂ්පාදිතය හෙවත් මූර්ත නිෂ්පාදිතය පිළිබඳ ඇස්තමේන්තු II (අ)-12 වැනි සංඛ්‍යා සටහනින් දැක්වෙයි. මූර්ත ජාතික ආදායම පිළිබඳ ඇස්තමේන්තු සකස් කිරීම සඳහා මෙම සංඛ්‍යා වෙළෙඳ අනුපාතයේ වෙනස්වීම් සමග ගලපා II (අ)–18 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. 1963 දී සියයට 3·9 කින් පහළ වැටුන ආනයන මූර්ත වටිනාකම, 1964 දී සියයට 9·2 කින් වේගයෙන් වැඩිවිය. රුපියල් කෝටි 4·1 කින් පහළ වැටුන තොගවල වටිනා කම ද ගනන් ගත්විට, අපනයන අංගයේ ශුද්ධ නිපැයුම මූර්ත වශයෙන් සියයට 7·0 කින් වැඩිවී ඇත. දේශීය අංගයේ වී, තේ හා පොල් නිෂ්පාදනය 1964 දී සියයට 2·6 කින් වැඩිවිය. 1963 දී සියයට 3·7ක්වූ රාජ්‍ය අංගයේ මූර්ත නිෂ්පාදිතය වැඩිවීමේ වේගය 1964දී සියයට 5·9 දක්වා වැඩිවිය. අනෙකුත් භාණ්ඩ හා සේවාවන්ද 1964 දී සියයට 2·9 කින් මූර්ත වශයෙන් වැඩිවිය. 1963 දී එය වැඩිවූයේ සියයට 2·7කිනි.

## සංඛ්‍යා සටහන II (අ) 11

### (දළ) දේශීය නිෂ්පාදිතයේ කාර්මික සැකැසුම් - පවත්නා සාධක වියදම් මිල අනුව

| කර්මාන්ත | 1959 | | 1960 | | 1961 | | 1962 | | 1963 | | 1964 | | වෙනසේ සියයට ගණන | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රුපියල් ලක්ෂ | සියයට ගණන | රුපියල් ලක්ෂ | සියයට ගණන | රුපියල් ලක්ෂ | සියයට ගණන | රුපියල් ලක්ෂ | සියයට ගණන | රුපියල් ලක්ෂ | සියයට ගණන | රුපියල් ලක්ෂ | සියයට ගණන | 1959න් 1960 ට | 1960න් 1961 ට | 1961න් 1962 ට | 1962න් 1963 ට | 1963න් 1964 ට |
| I. කෘෂිකමය, දැව ඇ වන ද්‍රව්‍ය, පශු සම්පත හා ධීවර කර්මාන්තය * .. .. .. | 2,763 | 47 | 2,872 | 47 | 2,857 | 46 | 2,907 | 45 | 2,983 | 44 | 3,121 | 44 | + 3·9 | — 0·5 | + 1·7 | + 2·6 | + 4·6 |
| II. පතල් හා ගල් කැඩීම .. .. . | 11 | ... | 11 | ... | 11 | ... | 12 | ... | 11 | ... | 10 | ... | + 6·7 | — 4·5 | +10·3 | — 6·8 | — 6·4 |
| III. නිෂ්පාදනය (ගොඩනැගිලි උපකරණ අත්හැර) .. .. .. .. | 271 | 5 | 317 | 5 | 353 | 6 | 417 | 7 | 499 | 7 | 553 | 8 | +17·0 | +11·1 | +18·3 | +19·6 | +10·8 |
| IV. ගොඩනැංවීම (ගොඩනැංවීමේ උපකරණ ඇතුළත්ව) .. .. .. .. | 384 | 7 | 349 | 6 | 385 | 6 | 429 | 7 | 424 | 6 | 419 | 6 | — 9·2 | +10·6 | +11·2 | — 1·2 | — 1·1 |
| V. ප්‍රවාහණය, ගබඩා කිරීම සහ පණිවුඩ හුවමාරුව | 471 | 8 | 512 | 8 | 498 | 8 | 523 | 8 | 545 | 8 | 617 | 9 | + 8·8 | — 2·9 | + 5·1 | + 4·1 | +13·3 |
| VI. තොග සහ සිල්ලර වෙළෙඳාම .. .. | 647 | 11 | 647 | 11 | 624 | 10 | 662 | 10 | 719 | 11 | 768 | 11 | ... | — 3·6 | + 6·1 | + 8·5 | + 6·9 |
| VII. බැංකු රක්ෂණය හා අනෙකුත් මූල්‍ය .. .. | 48 | 1 | 52 | 1 | 56 | 1 | 59 | 1 | 68 | 1 | 71 | 1 | + 8·6 | + 7·7 | + 5·7 | + 5·6 | + 4·0 |
| VIII. නිවාස අයිතිය .. .. .. | 169 | 3 | 178 | 3 | 196 | 3 | 205 | 3 | 223 | 3 | 238 | 3 | + 5·9 | + 9·9 | + 4·5 | + 8·9 | + 6·6 |
| IX. රාජ්‍ය පාලනය හා ආරක්ෂාව .. .. | 397 | 7 | 402 | 7 | 403 | 7 | 444 | 7 | 469 | 7 | 493 | 7 | + 1·4 | + 0·2 | +10·2 | + 5·5 | + 5·3 |
| X. සේවා: අන්තැනෙක නොසඳහන් | | | | | | | | | | | | | | | | | |
| (අ) රජයේ, වෛද්‍ය, සෞඛ්‍ය, අධ්‍යාපන, ගුවන් විදුලි සහ ආකාශ වස්තු පිරික්සුම් සේවා .. .. .. .. | 296 | 5 | 343 | 6 | 347 | 6 | 338 | 5 | 342 | 5 | 366 | 5 | +15·7 | + 1·1 | — 2·3 | + 1·2 | + 6·8 |
| (ආ) අනෙකුත් සියලු ම සේවා .. .. | 435 | 7 | 441 | 7 | 452 | 7 | 468 | 7 | 484 | 7 | 500 | 7 | + 1·6 | + 2·6 | + 3·3 | + 3·5 | + 3·2 |
| එකතුව .. .. .. | 731 | 13 | 784 | 13 | 799 | 13 | 806 | 13 | 826 | 12 | 865 | 12 | + 7·3 | + 1·9 | + 0·9 | + 2·5 | + 4·7 |
| **දළ - දේශීය නිෂ්පාදනය** .. .. | 5,891 | 100 | 6,124 | 100 | 6,182 | 100 | 6,464 | 100 | 6,769 | 100 | 7,155 | 100 | + 4·0 | + 0·9 | + 4·6 | + 4·7 | + 5·7 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

* කෘෂිකාර්මික අපනයන පිළිවෙළ කිරීම ද ඇතුළත් වෙයි.

සංඛ්‍යා සටහන II (අ) 12

## දළ - ජාතික නිෂ්පාදිතය - 1959 ස්ථාවර සාධක වියදම් මිල අනුව

| | 1959 පැවැති වටිනාකම රුපියල් දශ ලක්ෂ | | | | | | වෙනසේ සියයට ගණන | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1959න් 1960 ට | 1960න් 1961 ට | 1961න් 1962 ට | 1962න් 1963 ට | 1963න් 1964 ට |
| I. අපනයන සඳහා නිෂ්පාදිතය: | | | | | | | | | | | |
| (i) දේශීය අපනයන– නැවි. ස. වටිනාකම .. | 1,692 | 1,778 | 1,862 | 1,995 | 1,917 | 2,092 | + 5·1 | + 4·7 | + 7·2 | — 3·9 | + 9·2 |
| තොග වෙනස්වීමේ වටිනාකම .. | — 2 | — 37 | + 17 | — 37 | + 6 | — 41 | | | | | |
| පාවිච්චි කළ ආනයන භාණ්ඩ හැර (වෙළඳ මිල අනුව) | —124 | —120 | —133 | —157 | —169 | —178 | | | | | |
| අපනයන භාණ්ඩ බෙදා හැරීමේ වියදම් හැර .. .. | —104 | —108 | —110 | —118 | —115 | —121 | | | | | |
| නිපැයුම-ශුද්ධ . | 1,462 | 1,513 | 1,635 | 1,684 | 1,638 | 1,752 | + 3·5 | + 8·1 | + 3·0 | — 2·7 | + 7·0 |
| (ii) ප්‍රති අපනයන: එකතු කළ වටිනාකම .. | 3 | 2 | 2 | 2 | 1 | 1 | | | | | |
| **අපනයන සඳහා කැරුන මුළු නිෂ්පාදන නිපැයුම්-ශුද්ධ** | **1,465** | **1,515** | **1,638** | **1,686** | **1,640** | **1,754** | **+ 3·4** | **+ 8·1** | **+ 2·9** | **— 2·7** | **+ 7·0** |
| II. **දේශීය පාවිච්චිය සඳහා කැරුන නිෂ්පාදනය නිපැයුම- ශුද්ධ** | | | | | | | | | | | |
| (i) වී, තේ සහ පොල් නිෂ්පාදිත .. | 642 | 723 | 731 | 788 | 844 | 866 | +12·6 | + 1·1 | + 7·9 | + 7·0 | + 2·6 |
| (ii) රජයේ-අන්තැනෙක නොසඳහන් .. | 702 | 755 | 759 | 792 | 821 | 869 | + 7·6 | + 0·6 | + 4·3 | + 3·7 | + 5·9 |
| (iii) අනෙකුත් භාණ්ඩ සේවා .. | 3,082 | 3,129 | 3,173 | 3,277 | 3,367 | 3,464 | + 1·6 | + 1·4 | + 3·3 | + 2·7 | + 2·9 |
| **එකතුව** .. | **4,426** | **4,607** | **4,663** | **4,857** | **5,031** | **5,199** | **+ 4·1** | **+ 1·2** | **+ 4·2** | **+ 3·6** | **+ 3·3** |
| III. **දළ දේශීය නිෂ්පාදිතය** .. | **5,891** | **6,122** | **6,300** | **6,543** | **6,670** | **6,953** | **+ 3·9** | **+ 2·9** | **+ 3·8** | **+ 2·0** | **+ 4·2** |
| IV. **පිටරටින් ලැබුන සාධක ආදායම්- ශුද්ධ** .. | **— 37** | **— 44** | **— 40** | **— 50** | **— 51** | **— 34** | | | | | |
| V. **දළ ජාතික නිෂ්පාදිතය** .. | **5,854** | **6,078** | **6,260** | **6,493** | **6,620** | **6,919** | **+ 3·8** | **+ 3·0** | **+ 3·7** | **+ 1·9** | **+ 4·5** |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුව

ස්ථාවර මිල අනුව මුළු දේශීය නිෂ්පාදිතය (දළ) 1964 දී සියයට 4·2 කින් වැඩි විය. 1963 දී එය වැඩිවූයේ සියයට 2·0කින් පමණි. පිටරටින් ලැබෙන ශුද්ධ සාධක ආදායමෙහි හිඟය පසුගිය අවුරුද්දට වඩා අඩු විය. 1963 දී එය රුපියල් කෝටි 5·09ක්වූ අතර, 1964 රුපියල් කෝටි 3·42 ක් විය. පිටරටින් ලැබෙන(ශුද්ධ)සාධක ආදායම ද ඇතුලත් දළ ජාතික නිෂ්පාදිතය (ස්ථාවර මිල අනුව) සියයට 4·5 කින් වැඩිවිය. 1963දී එය වැඩිවූයේ සියයට 1·9 කින් පමණකි. 1964 දී සියයට 2·4 ක් වූ ජනගහනය වැඩිවීමේ අනුපාතිකයන් සමග සසඳා බලන කල මූර්ත ඒකජන නිෂ්පාදිතය 2·1 කින් වැඩිවී ඇත.

සංඛ්‍යා සටහන II (අ) 13

### මූර්ත ජාතික ආදයම සහ වියදම

| | රුපියල් දශ ලක්ෂ | | | | | | වෙනසේ සියයට ගණන | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1959න් 1960 ට | 1960න් 1961 ට | 1962න් 1963 ට | 1963න් 1964 ට | 1964න් 1965 ට |
| 1: දළ ජාතික නිෂ්පාදිතය 1959 ස්ථාවර සාධක වියදම් මිල අනුව .. | 5,854 | 6,078 | 6,260 | 6,493 | 6,620 | 6,919 | +3.8 | +3.0 | +3.7 | +1.9 | +4.5 |
| 2. පහත සඳහන් අපනයන නිසා වෙළෙඳ අනුපාතයේ බලපෑම | | | | | | | | | | | |
| (i) තේ .. .. | | — 26 | — 39 | + 2 | —134 | —157 | | | | | |
| (ii) රබර් .. .. | | + 39 | — 25 | — 14 | — 56 | — 94 | | | | | |
| (iii) පොල් නිෂ්පාදිත .. | | — 33 | —111 | — 96 | — 79 | —105 | | | | | |
| (iv) අනෙකුත් නිෂ්පාදිත .. | | + 6 | + 1 | + 5 | + 6 | + 9 | | | | | |
| (v) සියළුම නිෂ්පාදිත .. | | —14 | —173 | —102 | —262 | —346 | | | | | |
| 3. දළ ජාතික ආදයම- 1959 ස්ථාවර සාධක වියදම් මිල අනුව .. | 5,854 | 6,064 | 6,087 | 6,391 | 6,358 | 6,572 | +3.6 | +0.4 | +5.0 | —0.5 | +3.4 |
| 4: ආධාර හැර, අනියම බදු (ගලපා) .. | 389 | 403 | 405 | 425 | 422 | 437 | | | | | |
| 5. දළ-ජාතික වියදම්- 1959 ස්ථාවර වෙළෙඳ මිල අනුව .. | 6,243 | 6,467 | 6,492 | 6,816 | 6,780 | 7,009 | +3.6 | +0.4 | +5.0 | —0.5 | +3.4 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

1964 දී ආනයන මිල ඉහළ යාමත් සමග වෙළඳ අනුපාතය තවදුරටත් පිරිහී යාම හේතුකොට ගෙන වෙළඳ අනුපාතයේ බලපෑම රුපියල් කෝටි 34·6 දක්වා වැඩි විය. 1963 දී එය රුපියල් කෝටි 26·2ක් වූයේය. අපනයන නිෂ්පාදන වල හුවමාරු වටිනාකම කෙරෙහි බලපවත්නා මෙම අවාසිදායක වෙනස්වීම් හේතුකොට ගෙන මූර්ත ජාතික ආදයම වැඩිවූයේ සියයට 3·4 කින් පමණකි. එහෙත් මූර්ත නිෂ්පාදිතය සියයට 4·5 කින් වැඩිවූයේය.

## නිෂ්පාදනය හා අපනයනය

1959 සිට 1964 දක්වා වූ ප්‍රධාන කෘෂි භෝග නිෂ්පාදනය II (අ)-14 සංඛ්‍යා සටහනින් දක්වා ඇත. 1964දී තේ නිෂ්පාදනය පහළ වැටුනද, රබර් පොල් හා වී නිෂ්පාදනය 1963 දී අඩු වූ පොල් නිෂ්පාදනය 1964 දී සැලකිය යුතු අන්දමින් වැඩිවිය. රබර් හා වී නිෂ්පාදනය වැඩි වීමේ අනුපාතය පසුගිය වර්ෂයේදීට වඩා වැඩිවිය.

අපනයන වල වටිනාකම පවත්නා මිල හා 1959 මිල අනුව සකසා II (අ) 15 වැනි සංඛ්‍ය සටහනෙහි දක්වා ඇත. 1964 දී ප්‍රධාන අපනයන බෝග වල නෑ. වි ස. මිල වැඩිවිය. අපනයන කරන ලද තේ පරිමාව නොවෙනස්ව පසුගිය වර්ෂයේ මට්ටමෙහිම පැවතින. රබර් හා පොල් අපනයන පරිමාව වැඩිවිය. මුළු අපනයන වල නෑ. වි. ස. වටිනාකම සියයට 8·1 කින් වැඩිවිය. 1963 දී එය සියයට 3·5 කින් පහළ වැටිනි.

සංඛ්‍යා සටහන II (අ) 14

## ප්‍රධාන කෘෂිකාර්මික බෝග නිෂ්පාදන ප්‍රමාණය

| | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | සියයට ගණන | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | 1959න් 1960 ට | 1960න් 1961 ට | 1961න් 1962 ට | 1962න් 1963 ට | 1963න් 1964 ට |
| තේ (රාත්තල් දශ ලක්ෂ) .. | 413 | 435 | 455 | 467 | 485 | 482 | + 5·3 | + 4·6 | + 2·6 | + 3·9 | — 0·6 |
| රබර් (රාත්තල් දශ ලක්ෂ) .. | 205 | 218 | 215 | 229 | 231 | 246 | + 6·3 | — 1·4 | + 6·5 | + 0·9 | + 6·5 |
| පොල් නිෂ්පාදන * (ගෙඩි දශ ලක්ෂ ගණනින්) .. | 2,313 | 2,183 | 2,601 | 2,811 | 2,557 | 2,999 | — 5·6 | +19·1 | + 8·1 | — 9·0 | +17·3 |
| වී (බුසල් දශ ලක්ෂ) | 36·5 | 43·1 | 43·2 | 48·1 | 49·2 | 50·5 | +18·1 | + 0·2 | +11·3 | + 2·3 | +2·6 |

* කොප්පරා, කපාපු පොල්, පොල් තෙල් සහ ගෙඩි පොල්.

සංඛ්‍යා: තේ පාලකගේ පාලන වාර්තාව
රබර් පාලකගේ පාලන වාර්තාව
සංඛ්‍යා හා ජනලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව.

1959 මිල අනුව, 1963 දී සියයට 0·9 කින් වැඩි වූ තේ අපනයන, 1964 දී සියයට 0·1 කින් පහළ වැටුනේය. 1963 දී සියයට 5·9 කින් පහළ වැටුන රබර් අපනයනය 1964 දී සියයට 20·7 කින් වැඩිවිය. සියයට 18·2 කින් පහළ වැටුන පොල් අපනයනය 1964 දී සියයට 34·4 කින් වැඩි විය. මුළු අපනයන සියයට 9·2 කින් වැඩිවිය. 1963 දී එය සියයට 3·9 කින් පහළ වැටිණි.

### තේ

1963 අවසානයේදී අක්කර 5,87,375 ක්වූ තේ වගාව 1964 දී අක්කර 5,91,989 දක්වා වැඩිවිය. 1964 තේ නිෂ්පාදනය රාත්තල් කෝටි 48·2ක් විය. මෙය, 1963 දී රාත්තල් කෝටි 1·8 කින් හෙවත් සියයට 3·9 කින් වැඩිවූ තේ නිෂ්පාදනය සමග සසඳන විට රාත්තල් කෝටි 0·3ක් හෙවත් සියයට 0·6 කින් අඩුය. 1964 දී තේ නිෂ්පාදනය පහළ වැටීමට අසතුටු දායක කාලගුණය හේතුවූ බව කිය හැකිය.

1964 දී අපනයන කරන ලද තේ පරිමාව නොවෙනස්වම වාගේ රාත්තල් කෝටි 45·6ක් වූ 1963 මට්ටමෙහිම පැවතින. එහෙත් තේ රාත්තලක සාමාන්‍ය නැ. වි. ස. මිල සතයකින් සුළු වශයෙන් වැඩිවීම හේතුකොටගෙන තේ අපනයන වල වටිනාකම සියයට 0·1කින් වැඩිවිය.

1963 දී තේ අක්කර 2,293 ක් නැවත වගා කරන ලද අතර, 1964 දී අක්කර 3,201ක් නැවත වගා කරන ලදී. 1964 අවසාන වන විට නැවත වගා කරන ලද මුළු තේ අක්කර ගණන 9,692ක් විය.

### රබර්

1964 අවසාන වන විට වගාකර තිබුන රබර් ප්‍රමාණය අක්කර 6,69,179ක් විය. එයින් අක්කර 2,16,759 ක් නැවත වගා කිරීමේ ආධාර ක්‍රමය යටතේ නැවත වගා කරන ලද රබර් ඉඩම් විය. 1964 දී එම ක්‍රමය යටතේ නැවත වගා කරන ලද රබර් අක්කර ගණන 13,161ක් විය, පසුගිය වර්ෂය තුළදී නැවත වගා කරන ලද ප්‍රමාණය අක්කර 14,582ක් විය.

සංඛ්‍යා සටහන II (අ) 15

**අපනයන වටිනාකම–නැ. වි. ස.**

| | පවත්නා මිල | | | | | | | | | | | 1959 ස්ථාවර මිල | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රුපියල් දශ ලක්ෂ | | | | | | වෙනසේ සියයට ගණන | | | | | රුපියල් දශ ලක්ෂ | | | | | | වෙනසේ සියයට ගණන | | | | |
| | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1960න් 1959 ට | 1961න් 1960 ට | 1962න් 1961 ට | 1963න් 1962 | 1964න් 1963 ට | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1959න් 1960 ට | 1960න් 1961 ට | 1961න් 1962 ට | 1962න් 1963 ට | 1963 න් 1964 ට |
| **දේශීය අපනයන** | | | | | | | | | | | | | | | | | | | | | | |
| තේ .. .. | 1,046 | 1,097 | 1,115 | 1,149 | 1,141 | 1,142 | + 4.8 | + 1.7 | + 3.1 | — 0.7 | + 0.1 | 1,046 | 1,116 | 1,159 | 1,230 | 1,241 | 1,240 | + 6.7 | + 3.9 | + 6.1 | + 0.9 | — 0.1 |
| රබර .. .. | 298 | 378 | 260 | 290 | 257 | 290 | +27.1 | —31.3 | +11.6 | —11.5 | +12.9 | 298 | 337 | 286 | 324 | 305 | 368 | +13.2 | —15.2 | +13.5 | — 5.9 | +20.7 |
| පොල් සහ පොල් නිෂ්පාදන .. | 285 | 238 | 247 | 274 | 247 | 341 | —16.5 | + 3.8 | +10.6 | — 9.8 | +38.0 | 285 | 270 | 359 | 389 | 318 | 428 | — 5.6 | +33.2 | + 8.4 | —18.2 | +34.4 |
| අනෙකුත් .. .. | 63 | 62 | 58 | 53 | 60 | 70 | — 2.4 | — 5.2 | — 8.7 | +13.1 | +16.3 | 63 | 56 | 58 | 52 | 53 | 57 | —11.7 | + 4.3 | —10.5 | + 1.2 | + 8.4 |
| එකතුව .. .. | 1,692 | 1,775 | 1,681 | 1,766 | 1,705 | 1,842 | + 4.9 | — 5.3 | + 5.1 | — 3.5 | + 8.1 | 1,692 | 1,778 | 1,862 | 1,995 | 1,917 | 2,092 | + 5.1 | + 4.7 | + 7.2 | — 3.9 | + 9.2 |
| **ප්‍රති අපනයන එකතුව** | 62 | 57 | 52 | 42 | 26 | 34 | — 7.9 | — 7.9 | —18.9 | —38.2 | +30.8 | 62 | 58 | 57 | 49 | 29 | 38 | — 6.5 | — 0.4 | —15.0 | —39.9 | +31.0 |

සංඛ්‍යා: ලංකා රේගු වාර්තා:
ශ්‍රී ලංකා මහ බැංකුව.

1963 දී රාත්තල් කෝටි 23·1ක් වූ රබර් නිෂ්පාදනය 1964 දී රාත්තල් කෝටි 24·6 දක්වා වැඩිවිය. මෙයින් රාත්තල් කෝටි 1·5 ක හෙවත් සියයට 6·5 ක වැඩි වීමක් පිළිබිඹු කැරිණි. 1963දී රබර් නිෂ්පාදනය වැඩිවූයේ රාත්තල් කෝටි 0·2 කින් හෙවත් සියයට 0·9කිනි. 1964 දී රබර් නිෂ්පාදනය වැඩිවූයේ ප්‍රධාන වශයෙන් ම වැඩි වැඩියෙන් පොහොර යෙදීමත් නැවත වගාකරන ලද ඉඩම් කිරි කැපීමේ වයසට පැමිණීමත් හේතුකොට ගෙනය. තවද, රබර් වගාකරන ලද පෙදෙස්වල කාලගුණය යහපත් වීම රබර් නිෂ්පාදනය වැඩිවීමට තුඩු දුන් තවත් හේතුවකි.

රබර් රාත්තලක සාමාන්‍ය අපනයන මිල සියයට 6·5කින් පහළ වැටී තිබියදීත් රබර් අපනයන වල වටිනාකම සියයට 12·9කින් වැඩි විය. මෙයට හේතු වූයේ 1963 දී රාත්තල් කෝටි 20·9ක් වූ රබර් අපනයන පරිමාව 1964 දී රාත්තල් කෝටි 25·3 දක්වා වැඩිවීමය. මෙය රාත්තල් කෝටි 4·4 ක හෙවත් සියයට 20·8 ක වැඩිවීමකි.

**පොල්**

රට තුළ ප්‍රයෝජනයට ගත් හා අපනයනය කරන ලද පොල්ගෙඩි ප්‍රමාණය අනුව සැකසූ ඇස්තමේන්තු අනුව, 1964 පොල් නිෂ්පාදිතය ගෙඩි කෝටි 299·9ක් විය. 1963 දී නිෂ්පාදිතය, (ප්‍රතිශෝධිත ගණන) ගෙඩි කෝටි 255·7ක් විය. මේ අනුව, 1964 පොල් නිෂ්පාදිතය සියයට 17·3කින් වැඩිවී ඇත. 1963 දී අයහපත් කාලගුණය නිසා පොල් නිෂ්පාදනය සියයට 9·0 කින් පහළ වැටිනි.

1964 දී පොල් අපනයනය (උපයෝගී කරගත් ගෙඩි ප්‍රමාණය අනුව) ගෙඩි කෝටි 121·6 සිට ගෙඩි කෝටි 162·6 දක්වා වැඩිවිය. පසුගිය වර්ෂයේ ඇතිවූ සියයට 20·9 පහල වැටීම හා සසඳන කල මෙම වර්ෂයේ පොල් අපනයන සියයට 33·7කින් වැඩිවී ඇත. අපනයන වටිනාකමද සියයට 38·0කින් වැඩිවිය. 1963 දී එය සියයට 9·8 කින් පහළ වැටී තිබිණ.

**වී**

1964 දී වී වගාව, ඊට ප්‍රථම වර්ෂයේදීට වඩා සුළු අනුපාතිකයකින් වැඩිවූයේය. මාස් කන්නයේ අස්වැන්න බුසල් කෝටි 3·21ක් විය. පසුගිය වර්ෂයේ මාස් කන්නයේ අස්වැන්න බුසල් කෝටි 3·16 කි. 1964 යල් කන්නයේ වී වගාව බුසල් කෝටි 1·84 ක් විය. පසුගිය වර්ෂයේ යල්කන්නයේ වී වගාව බුසල් කෝටි 1·76ක් වූයේය. මේ අනුව කන්න දෙකේම වී නිෂ්පාදනය, 1963 දී බුසල් කෝටි 4·92ක් වූ අතර, 1964 දී බුසල් කෝටි 5·05 දක්වා වැඩි විය. 1963 දී ඇතිවූ සියයට 2·3 වැඩිවීමක් සමග සසඳ බලන කල 1964 වී නිෂ්පාදනය සියයට 2·6කින් වැඩිවී ඇත. අක්කරයක සාමාන්‍ය අස්වැන්න 1963 දී බුසල් 37·9 ක් වූ අතර 1964දී බුසල් 38·8 දක්වා වැඩිවිය.

සහල් ප්‍රමාණය අනුව මණින කල, 1963 දී සහල් ටොන් 668407 ක්වූ වී නිෂ්පාදනය 1964 දී ටොන් 686779ක් වූයේය. 1963 දී ටොන් 5,10,000ක් * වූ සහල් ආනයනය 1964 දී ටොන් 5,47,000 දක්වා වැඩි විය. සහතික මිල ක්‍රමය යටතේ ගත් වී ප්‍රමාණය 1963 දී බුසල් කෝටි 2·78ක් වූ අතර 1964 දී බුසල් කෝටි 2·98 දක්වා වැඩිවිය. 1963 දී මුළු සහල් පරිභෝජන (ප්‍රතිශෝධිත) ප්‍රමාණය වන ටොන් 11,37,954 හා සසඳ බලන කල 1964 දී තාවකාලිකව ඇස්තමේන්තු කර ඇති ප්‍රමාණය ටොන් 11,38,944 කි.

* ආහාර කොමසාරිස් වරයාගේ සංඛ්‍යා